# 01 ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍ර

මූලාශ්‍ර යනු - ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන සියලුම දේවල්.

මූලාශ්‍ර වර්ගීකරණය - ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රය වර්ග දෙකකට බෙදා දැක්විය හැකිය.

1. සාහිත්‍ය මූලාශ්‍රය
2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

**<u>සාහිත්‍ය මූලාශ්‍රය</u>**

අතීත ප්‍රජාව විසින් විවිධ කාල වකවානු වල ලියන ලද ග්‍රන්ථ හෝ ලේඛන සාහිත්‍ය මූලාශ්‍ර ලෙස සැලකේ. ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සොයාගත හැකි සාහිත්‍ය මූලාශ්‍ර වර්ග 2 කි.

1. දේශිය සාහිත්‍ය මූලාශ්‍රය
2. විදේශිය සාහිත්‍ය මූලාශ්‍රය

දේශිය සාහිත්‍ය මූලාශ්‍රය - පැරණි ඉතිහාස අධයයනය කිරීමට අදින් වසර දෙදහසකට පමණ පෙර සිට ලාංකිකයන් විසින් ගද්‍ය හා පද්‍ය වශයෙන් වරින් වර ලියන ලද කෘති දේශිය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස සැලකේ.

පුරාන ඉතිහාසය අධ්‍යයනය කිරීමට පුවත්පත්, සඟරා, පොත්, වාර්තා, ගැසට් පත්‍ර

දේශිය සාහිත්‍ය මූලාශ්‍රය හා එහි වැදගත්කම

| මූලාශ්‍රය | වැදගත්කම |
|---|---|
| දීපවංසය | ක්‍රි. ව. 4 වන සියවසේදි රචනා කර ඇත. මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් මෙරට ඓතිහාසික තොරතුරු හා ශාසන ඉතිහාසය සම්බන්ධ පුවත් ඇතුළත් වේ. දුර්වලතා - කෙටියි, පුනරුක්ති දෝෂ ඇත. |
| මහාවංසය | ක්‍රි. ව. 5-6 සියවසේදි රචිතය. ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව ලියා තිබීම. මුල් කොටස දික්සඳ සෙනෙවියා පිරිවෙන විසු මහානාම හිමි විසින් රචිතය. එහි මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් මෙරට ඓතිහාසික තොරතුරු හා ශාසන ඉතිහාසය සම්බන්ධ පුවත් ඇතුළත් වේ. |
| මහාවංස ටීකාව (වංසත්ථප්පකාසිනි) | මහාවංසයේ මුල් කොටසේ එන ඇතැම් තැන් තවත් විස්තර කොට අර්ථ විවරණය කර තිබීම. |
| බෝධිවංසය<br>ථූපවංසය<br>ධාතුවංසය<br>පූජාවලිය<br>සද්ධර්මාලංකාරය | රජරට ශිෂ්ඨාචාර සමයේ ඉතිහාසය හැදෑරීමට වැදගත් වීම. |
| නිකාය සංග්‍රහය | මෙරට ශාසන ඉතිහාසය පිළිබඳව ලියවී ඇත. |
| රාජාවලිය | දේශපාලන තොරතුරු සටහන් වීම. ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය කාලය දක්වා ඉතිහාසය හැදෑරීමේදි වැදගත් වීම. |
| සංදේශ කාව්‍ය<br>ප්‍රශස්ති කාව්‍ය<br>හටන් කාව්‍ය | කෝට්ටේ රාජ්‍ය කාලයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ඉතිහාසය හැදෑරීමේදි වැදගත් වීම. |

❖ මහාවංසයට මූලාශ්‍රයන් - දීපවංශය, සීහලට්ඨකතා මහාවංසය, උත්තරවිහාරට්ඨිකතා, විනයට්ඨකතා

❖ ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගැනීමේදී සැළකිලිමත් විය යුතු කරුණු.
1. මූලාශ්‍රය රචනා වූ කාලය.
2. මූලාශ්‍රයේ කතුවරයා.
3. කතුවරයාගේ අරමුණු.
4. මූලාශ්‍රයට කරුණු සපයා ගත් ආකාරය.

❖ <u>විදේශිය සාහිත්‍ය මූලාශ්‍රය</u> - විදේශිකයන් විසින් මෙරට පිළිබඳ තොරතුරු සඳහන් කරමින් ලියන ලද කෘති විදේශිය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස හැඳින්වේ.

❖ විදේශිය මූලාශ්‍රය වල ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වීමට බලපෑ හේතු.

- අනුරාධපුර යුගයේ මුල් භාගයේ සිටම ශ්‍රී ලංකාව විදේශ රටවල් සමග වෙළඳ සබඳතා පැවැත්වීම හා ආක්‍රමණ සංක්‍රමණ සිදුවීම.
- ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අතීතයේ සිට පැවති සමීප සබඳතා. උදා-සීලප්පදිකාරම්, මණිමේකලෛයි, පදිර්රුපත්තු
- පෘතුගීසි , ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතීන් මෙරට යටත් විජිතයක්ව පවත්වා ගැනීම.

❖ <u>ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැක බලා ඒ පිළිබඳ තබන ලද වාර්තා හා ඒවායේ කතුවරු.</u>

| | |
|---|---|
| චීන මූලශ්‍රාය | පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාව |
| ආරාබි මූලාශ්‍රය | ඉබන් බතූතාගේ දේශාටන වාර්තාව |
| පෘතුගීසි මූලාශ්‍රය | රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය |
| ඕලන්ද මූලාශ්‍රය | ෆිලිප්පස්ගේ බැල්ඩියස්ගේ කෘතිය |
| ඉංග්‍රීසි මූලාශ්‍රය | රොබට් නොක්ස්ගේ කෘතිය ( එදා හෙළදිව ) |

වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ තැබූ වාර්තා

ග්‍රීක මූලාශ්‍රය - ඇරිස්ටෝටල්ගේ ඩිමුන්ඩෝ කෘතිය.
මෙගස්තිනියස්ගේ ඉන්ඩිකා කෘතිය.
ඔනෙසික්‍රිටස්ගේ වාර්තා.

රෝම මූලාශ්‍රය - ප්ලිනිගේ නැචුරලිස් හිස්ටෝරියා කෘතිය.
ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය කෘතිය.
ටොලමිගේ ලංකා සිතියම.

චීන මූලාශ්‍රය - හියුං සියෑං ඉත්සිං භික්ෂූන්ගේ දේශාටන වාර්තා කෘතිය.

පෘතුගීසි මූලාශ්‍රය - ෆර්නාඩ් ඩී ක්වේරොස් පියතුමාගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය.

❖ <u>**සාහිත්‍ය මූලාශ්‍රයවල ප්‍රයෝජන**</u>

1. ඓතිහාසික කාල අනුපිළිවෙල සකස් කර ගැනීමට.
2. එක් එක් අවධිවල දේශපාලන , ආර්ථික , සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට.
3. එක් මූලාශ්‍රයක් මගින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මගින් සනාථ කර ගැනීම.
4. රටක විදේශිය සබඳතා අධ්‍යයනය කිරීම.

❖ **<u>පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය</u>**

පුරාවිද්‍යා කැණීම් හා පර්යේෂණ මගින් සොයා ගැනෙන අභිලේඛන , කාසි , පුරාණ නටබුන් , චිත්‍ර , මූර්ති හා පුරාවස්තු ආදිය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස හඳුන්වයි.

❖ අභිලේඛන - අභිලේඛන යනු ගල් (ශිලා) , මැටි පුවරු , බිත්ති , තඹ තහඩු , රන් තහඩු , දැව හා විවිධ භාජන ආදියෙහි ලියා ඇති පැරනි ලේඛන පොදුවේ හැඳින්වීමට යොදන පදයකි.

❖ අභිලේඛන ලියා ඇති එකිනෙකට වෙනස් මාධ්‍ය කිහිපයක් පහත දැක්වේ.

| අභිලේඛන ලියා ඇති මාධ්‍ය | උදාහරණ |
|---|---|
| ශිලා (ගල්) | නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ලිපිය. |
| බිත්ති | සීගිරි ගී |
| තඹ තහඩු | පළමුවන විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නස |
| රන් තහඩු | වල්ලිපුරම් රන්පත |
| දැව | උැම්බැක්කේ දේවාලයේ කණුවල ලියූ ලේඛන |
| මැටි පුවරු | උළු හා ගඩොල් මත ලියූ අකුරු |
| භාජන | මැටි වළං , පාත්‍ර ආදියෙහි ලියූ අකුරු |

ශිලා ලේඛන යනු - ගල් මත ලියූ ලිපිය

❖ ශිලා ලිපි හෙවත් සෙල්ලිපි ලියා ඇති ගල්වල ස්වරූපය අනුව ඒවා වර්ග කළ හැකි ආකාරය.

ලෙන් ලිපි (කටාරම් ලිපි) - ගල් ලෙන් වල කටාරම අසල ලියූ ලිපි.
ගිරි ලිපි - ගල් තලාව හෝ ගල් කුළු මත ලියූ ලිපි.
ටැම් ලිපි - සකස් කරගත් ගල් කුලුණු මත ලියූ ලිපි.
පුවරු ලිපි - සකස් කරගත් ගල් පුවරු මත ලියූ ලිපි.
ආසන ලිපි - මල් ආසන මෙන් තැබූ ගල් පුවරු මත ලියූ ලිපි.

❖ ක්‍රි. ව. දෙවන සියවසින් පසු ශිලා ලිපි පිහිටුවීමට බලපෑ කරුණු.

- ❑ විහාරාරාමවලට ගම්බිම් පිදීම.
- ❑ විහාරාරාම පාලනය.
- ❑ රජයේ නීති මහජනයාට දැනුම් දීම.
- ❑ බදු අය කිරීම.
- ❑ වෙළදාම.
- ❑ වැරදිකරුවන්ට සමාව දීම.
- ❑ පුද්ගලයන්ගේ සේවය ඇගයීම වැනි කරුණු වාර්තා කර තැබීමට.

**කාසි** - (නාණක විද්‍යාව)

- ❑ පැරණි කාසි පිළිබඳ හදාරණ විෂය නාණක විද්‍යාවයි.
- ❑ මෙරටින් හමුවන පැරණිම කාසි <u>කහපණ</u> ලෙස හැඳින්වේ. (පුරාණ-ධරණ)
- ❑ ඇතා සහ ස්වස්තික කාසි , ලක්ෂ්මී කාසි , අක නම් රන් කාසි මෙරට භාවිතා කර ඇත.
- ❑ පොලොන්නරු රාජ්‍ය සමයේ <u>තඹ මස්ස</u> භාවිතා කර ඇත.
- ❑ විදේශ කාසි-රෝම, චීන, ඉන්දියානු කාසි, පර්සියන්

වැදගත්කම - රටෙහි ආර්ථිකය, වෙළදාම, ලෝහ භාවිතය, හා කාසි අච්චු භාවිතය හැදෑරීමට හැකිය

**පුරාණ නටඹුන් -**

- මෙරට ඉතිහාසය හැදෑරිමේදි මෙකි නටඹුන් හොඳ මූලාශ්‍රයකි.
- වැදගත්කම - පැරණි ජනයාගේ නිර්මාණාත්මක හැකියා, තාක්ෂණ ගොඩනැගිලි නිර්මාණය හා වාස්තු විද්‍යාව, ශිල්පීය දක්ෂතා, පරිසර සංරක්ෂණය හා ජල පාලනය හදුනාගත හැකිය.

**චිත්‍ර මූර්ති -**

- පැරණි චිත්‍ර , මූර්ති හා කැටයම් ආදිය තුළින් රටක සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කරයි.
- අතිත ජනතාවගේ ඇඳුම් පැළඳුම් , කලා කුසලතාව , ආභරණ පරිහරණය , වර්ණ භාවිතය , සන්නිවේදනය, ආගමික විශ්වාස ආදි අංග පිළිබඳ තොරතුරු ලබා ගැනිමට චිත්‍ර , මූර්ති හා කැටයම් උපකාරී වේ.

**පුරා වස්තු -**

- පැරණි ජනතාව විසින් නිර්මාණය කරන ලද හෝ පරිහරණය කරන ලද හෝ දැනට ඉතිරිව ඇති දේ පුරාවස්තු ලෙස හැදින්වේ.
- වැදගත්කම - පැරණි ජනයාගේ විවිධ හැකියා, තාක්ෂණය, විදේශ සබඳතා ජිවන ක්‍රම හදුනාගත හැකිය.

❖ <u>**ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම**</u>

- තමා ජිවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය.
- අතිත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය හදුනා ගැනිම.
- රටේ ජාතික අනන්‍යතාවය හඳුනා ගැනිම.
- මනුෂ්‍යත්වයට ආදරය කිරීමෙන් ජාතික සමගිය ගොඩනැගිම.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිමට පුරුදුවීම.
- විවිධ මත ඉවසිමට හුරු වීම.

❖ <u>**පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය විනාශ වන ක්‍රම**</u>

- ජනාවාස ව්‍යාප්තිය.
- මංමාවත් තැනිම.
- ගොඩනැගිලි ඉදිකිරීම.
- කෘෂිකාර්මික කටයුතු.
- පුරාවස්තු භාරා විනාශ කිරීම.
- පුරාවස්තු මත ලිවිම රූප ඇඳිම.

❖ නිතිය දැඩිව ක්‍රියාත්මක කිරිම හා වටිනාකම පහදාදිම මගින් දැනුවත් කිරීම, ආරක්ෂාවට ගතහැකි ක්‍රියාමාර්ග.

## ඇගයීම 1

පහත සඳහන් එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

01. වංසත්ථප්පකාසිනී කවර වංස කතාවකට ලියන ලද ටීකාවක් ද ?

1. දීපවංසය 2. මහාවංසයේ මුල් කොටස 3. ථූපවංසය 4. බෝධිවංසය

02. ක්‍රි. ව. 4 වන සියවසේදී පමණ රචනා කරන්නට ඇතැයි සැලකෙන මෙරට වංසකතාව වන්නේ,

1. මහාවංසය 2. විශුද්ධිමාර්ගය 3. දීපවංසය 4. ථූපවංසය

03. මෙරට ශාසන ඉතිහාසයට මුල් තැනක් දෙමින් රචිත ග්‍රන්ථයක් වන්නේ,

1. රාජාවලියයි. 2. රාජරත්නාකරයයි. 3. නිකාය සංග්‍රහයයි. 4. විනයට්ඨකතාවයි.

04. පහත දැක්වෙන පුද්ගලයන් අතුරෙන් ශ්‍රී ලංකාවට පැමිණ තොරතුරු අධ්‍යයනය කොට වාර්තා සැකසූවන් දැක්වෙන පිළිතුර කුමක්ද ?

| | | | | | |
|---|---|---|---|---|---|
| A | - | මෙගස්තිනියස් | B | - | පාහියන් හිමි |
| C | - | ටොලමි | D | - | ඉබන් බතූතා |
| E | - | රොබට් නොක්ස් | F | - | හියුං සියැං |

1. B , D හා E 2. C , D හා E 3. B , D හා F 4. A , B හා D

05. ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි ග්‍රීක මූලාශ්‍රයක් නොවන්නේ කුමක් ද ?

1. ඩිමුන්ඩෝ 2. ඉන්ඩිකා 3. නැචුරලිස් හිස්ටෝරියා 4. ඔනෙසික්‍රිටස්

06. ගල් කණු වල ලියූ ලේඛන අයත් වන්නේ කුමන මූලාශ්‍ර වර්ගයට ද ?

1. නටඹුන් 2. අභිලේඛන 3. නාණක 4. සාහිත්‍ය

07. I විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නස ලියා ඇත්තේ පහත නම් සඳහන් කුමන නිලධාරියාට කෘතගුණ දැක්වීම සඳහා ද ?

1. සංඛපාල සෙනෙවි 2. සුභ සෙන්පති 3. සිත්නාරුබිම බුදල්නා 4. ජෝතිය සිටුවරයා

08. අතීතයේ ලියන ලද ශිලා ලේඛන සම්බන්ධයෙන් සාවද්‍යා ප්‍රකාශය වන්නේ,

1. රජයේ නීති මහජනයාට දැනුම්දීම.
2. රජුන්ගේ විවාහ සබඳතා වාර්තා කිරීම සඳහා.
3. පුද්ගලයින්ගේ සේවය ඇගයීම සඳහා.
4. විහාරස්ථාන සඳහා ගම්බිම් පිදීම ලියා දැක්වීම සඳහා.

09. ලංකාවෙන් හමුවන පැරණිතම කාසි හඳුන්වන නාමය වන්නේ,

1. කහපණ 2. ලක්ෂ්මි කාසි 3. වී. ඕ. සී. කාසි 4. තඹ මස්ස

10. ගල්තලාවල හෝ ගල්කුළු මත ලියූ ලිපි හඳුන්වනු ලබන්නේ,

1. පුවරුලිපි 2. ටැම්ලිපි 3. ගිරිලිපි 4. ලෙන්ලිපි

# 02 ශ්‍රී ලංකාව ජනාවාස වීම

- ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත්වූයේ මිට අවුරුදු එක්ලක්ෂ විසිපන්දහසකට පමණ කාල වකවානුවකදිය.

- නූතන මානවයා නමින් හැඳින්වෙන හෝමෝ සාපියන්වරු මෙරටට සංක්‍රමණය වී විවිධ පරිසර කලාප වලට හැඩ ගැසෙමින් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල වාසය කළහ.

**<u>ප්‍රාග් ඓතිහාසික යුගය.</u>**

- සාහිත්‍ය මූලාශ්‍රය මගින් විස්තර කෙරෙන අතීත කාලයේ ආරම්භයට පෙර තිබූ යුගය ප්‍රාග් ඓතිහාසික යුගය නමින් පොදුවේ හැඳින්වේ.

ප්‍රාග් ඓතිහාසික යුගය

- ගල් යුගය (ප්‍රාග් ඓතිහාසික)
- පූර්ව ඓතිහාසික යුගය

- මෙය <u>"ගල් යුගය" හෙවත් "මධ්‍ය ශිලා යුගය"</u> නමින් ද හැඳින්වේ.

  සාක්ෂි - අර්ධ ශුෂ්ක කලාපයේ ඉරණමඩු සැකැස්ම, රත්නපුරය හා එහි අවට මැණික් පතල්

ශ්‍රී ලංකාවේ පරිසර කලාප තීරණය කරන ප්‍රධාන සාධකය වාර්ෂික වර්ෂාපතනයයි. ඒ අනුව ප්‍රධාන පරිසර කලාප 6 ක ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත් වී තිබේ. එනම්,

1. ශුෂ්ක කලාපය.
2. අර්ධ ශුෂ්ක කලාපය.
3. තෙත් කලාපය.
4. පහතරට වියළි කලාපය.
5. පහතරට අතරමැදි වියළි කලාපය.
6. කඳුකර වියළි අතරමැදි කලාපය.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සාධක හමුවන ස්ථාන හා කාල වකවානු

| | | |
|---|---|---|
| පතිරාජවෙල | - | වසර 125000 |
| බූන්දල වැල්ලෙගංගොඩ | - | වසර 80000 |
| පාහියන්ගල | - | වසර 48000 |
| කුරුවිට බටදොඹලෙන | - | වසර 28000 |
| කිතුල්ගල බෙලිලෙන | - | වසර 15000 |
| බෙල්ලන්බැඳිපැලැස්ස | - | වසර 12000 |
| අත්තනගොඩ අළුලෙන | - | වසර 10350 |
| මානියම්ගම | - | වසර 7900 |
| සීගිරිය පොතාන | - | වසර 5800 |
| සීගිරිය අලිගල | - | වසර 5500 |
| උඩමළල | - | වසර 5330 |
| මාතොට | - | වසර 3800 |

**ප්‍රාග් ඓතිහාසික ජනාවාස වල මූලික ලක්ෂණ**

- ❑ ප්‍රාග් ඓතිහාසික මානවයා එකිනෙකට වෙනස් පරිසර තත්ත්වවලට අනුවර්තනය වෙමින් ව්‍යාප්ත වී තිබීම.
- ❑ ආහාර සඳහා අවශ්‍ය කරන ස්වභාවික සම්පත් බහුල ප්‍රදේශ වල වාසයට වැඩි කැමැත්තක් දැක්වීම.
- ❑ ජලය හා ගල් මෙවලම් තනාගැනීමට අවශ්‍ය පාෂාණ වර්ග බහුල ප්‍රදේශ වල ජීවත් වීම.
- ❑ වියළි කාලගුණයක් පවත්නා කාල වලදී එළිමහන් තැන්වලත් වර්ෂා කාල වලදී ස්වභාවික ගල්ගුහා වලත් ජීවිත් විය.

උදා :- පහතරට වැසි වනාන්තර ප්‍රදේශ, වියළි කලාපීය වනාන්තර, මුහුදුබඩ කලපු, විල්ලු, කඳුකර තණබිම්.

**දැනට හඳුනාගෙන ඇති ප්‍රාග් ඓතිහාසික එළිමහන් කඳවුරු හා ගල්ගුහා වාසස්ථාන.**

1. මිනිහාගල්කන්ද , බුන්දල , පතිරාජවෙල ( වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන )
2. පාහියන්ගල , බටදොඹලෙන , කිතුල්ගල බෙලිලෙන ( පහතරට තෙත් කලාපීය ලෙන් )
3. සීගිරියේ පොතාන සහ අලිගල ( පහතරට වියළි කලාපීය ලෙන් )
4. බෙල්ලන්බැඳිපැලැස්ස ( තෙත් කලාපීය වාසස්ථාන )
5. බණ්ඩාරවෙල , හෝර්ටන් තැන්න ( කඳුකර එළිමහන් වාසස්ථාන )

**ප්‍රාග් ඓතිහාසික ජනයාගේ ජීවන රටාව**

- ❑ වර්ෂයේ වැඩි කාලයක් සංචාරක ජීවිතයක් ගතකර ඇත.
- ❑ දඩයම් කිරීමෙන් හා ආහාරයට ගත හැකි ස්වාභාවික දේ එකතු කිරීමෙන් සිය ජීවිකාව පවත්වාගෙන යාම.
- ❑ ජන ගහනය කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වී තිබීම.
- ❑ ඇතැම් අවස්ථා වල තමන්ගේ මියගිය ඥාතීන්ගේ මළ සිරුරු ගුහා ඇතුළත වල දැමීම.
  නිදසුන් :- කිතුල්ගල බෙලිලෙන , බෙල්ලන්බැඳිපැලැස්ස , පාහියන්ගල.

**ආහාර රටාව**

සත්ත්ව ආහාර -

- ❑ ගවයා , කුළු මී හරකා , කළු වලහා , වල් ඌරා , ගෝනා , තිත්මුවා , මීමින්නා , ඉත්තෑවා , හාවා , දඬුලේනා , හම්බාවා , මුගටියා , උරුලෑවා , වඳුරා , වලිකුකුළා , හබන් කුකුළා , තලගොයා ආහාර සඳහා දඩයම් කිරීම.
- ❑ මිරිදිය මාළු වර්ග(තිත්තයා) හා ගොළුබෙල්ලන් (ගස් ගොළුබෙල්ලන්, කලපු බෙල්ලන්) ආහාරයට ගැනීම.

ශාක ආහාර -

- ❑ පිෂ්ඨය ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් වල්දෙල් හා කැළැකෙසෙල් ද මීට අමතරව ගෝනල , කටුඅල , කිතුල් ඇට , දෝතලු ඇට ආහාරයට ගැනීම.
- ❑ ආහාර පුළුස්සා අනුභව කළ බවට සාක්ෂි හමු වී ඇත.
- ❑ ආහාර සඳහා ලුණු ලබා ගත් බවට ද කිතුල්ගල බෙලිලෙනින් සාක්ෂි හමුව ඇත.

**ගල් යුගයේ තාක්ෂණය**

- ❑ මෙම යුගයේ තාක්ෂණය ගැන දැනගැනීමට තිබෙන එකම සාධකය ගල් මෙවලම්ය.
  උදා :- ජ්‍යාමිතික ක්ෂුද්‍ර ගල් මෙවලම්
- ❑ තිරිවාන ගල් සහ කහඳ ගල් භාවිතා කොට ක්ෂුද්‍ර ගල් මෙවලම් නිශ්පාදනය කර ඇත.
- ❑ මිටි , ඇඹරුම්ගල් ආදියද එකළ නිපදවා තිබේ.

**<u>මිනිසුන්ගේ ශරීර ස්වභාවය</u>**

- වැඩුණු පිරිමියකුගේ අස 174 cm වේ. කාන්තාවකගේ 166 cm කට වඩා උස් නොවිය.
- දත් විශාල වන අතර පළල් නාසයක් හා නිකටක් තිබී ඇත.
- වැඩුණු පිරිමියකුගේ මොළයේ විශාලත්වය ඝනසෙන්ටිමීටර් 1600 කි . එය කාන්තාවකගේ ඝනසෙන්ටිමීටර් 920 කි.
- උපරිම ආයු කාලය වසර 35 - 40 පමණ ඇතැයි සැළකේ.

**<u>අභිචාර විධි</u>**

මෙම යුගයට අයත් මිනී වැළලීම සම්බන්ධයෙන් අභිචාර විධි සම්බන්ධ තොරතුරු සමහරක් ලැබේ.

- බදුල්ලට නුදුරු රාවනා ඇල්ල ගුහාවෙන් -

  දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද මිනිස් හිස් කබලක් මතුවී ඇත. රනි රළුවට පිහිටි දාර සහ පිටතට නෙරා තිබූ කොටස් ගලක උලා ගුරුගල් ආලේපකර ඇත.

- පාහියන්ගල ගල්ගුහාවෙන් -
  රතු පැහැති ගුරු ගල් ආලේප කරන ලද මිනිස් ඇට සැකිළි හමුවීම.

- කුරුවිට බටදොඹ ලෙනෙන් -
  නමා වකුටුකර වළලා තිබූ ඇටසැකිළි හමු වීම.

## පූර්ව ඓතිහාසික යුගය.

- ප්‍රාග් ඓතිහාසික යුගයේ අවසානයත් , ඓතිහාසික යුගයේ ආරම්භයත් අතර කාල පරිච්ජේදය පූර්ව ඓතිහාසික යුගය ලෙස හැඳින්වේ.
- තාක්ෂණික වශයෙන් මෙය සංක්‍රාන්තික යුගයකි.
- යකඩ භාවිතය ආරම්භ වීම නිසා මෙම යුගය පූර්ව ඓතිහාසික යකඩ යුගය යනුවෙන්ද මුල් යකඩ යුගය යනුවෙන්ද හැඳින්වේ.

## ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන

**මහා ශිලා සුසාන සම්ප්‍රදාය** :- ශිලා මංජුසා සොහොන්

- මෙම සුසාන විහාල ගල් පතුරු එක්තැන්කොට චතුරස්‍රාකාර හැඩයකට සකසා ගල් පුවරුවකින් ආවරණය කර ඇත.
- මිනිස් භෂ්මාවශේෂ සහිත වළං එම සුසාන ගර්භය තුළ තැන්පත් කර ඇත.
- මේවා <u>ශිලා මංජුසා සොහොන්</u> යනුවෙන් ද හඳුන්වයි.

  නිදසුන් :- ඉබ්බන්කටුව මහා ශිලා සුසානය.
  යාපහුව ගල් සොහොන් කනත්ත සුසානය.
  යටිගල්පොත්තේ සුසානය.

**බරණි සොහොන්** :-

- විශාල මැටි බඳුනක් (බරණියක්) තුළ මිනිස් භෂ්මාවශේෂ සහිත මැටි බඳුනක් තැන්පත් කර ඇත.

  උදා :- යොම්යරියප්පුව

**මැටි ඔරු සුසාන :-**

- අමු මැට්ටෙන් සකසන ලද ඔරුවක හැඩැති බේසමක භෂ්මාවශේෂ බහා ලූ මැටි වළං තැන්පත් කිරීම මෙම ක්‍රමයයි.

- භෂ්මාවශේෂ තැන්පත් කිරීමට පෙර මිනිස් ඇටසැකිළි මැටිඔරු තුළ දමා ආදාහනය කිරීම නිසා එය දිගු කාලයක් නොනැසී පවතී.
  නිදසුන් :- ඌව පළාතේ බෙරගල හා හල්දුමුල්ල සුසාන, රංචාමඩම.

**පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස වල ස්වභාවය**

- ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනගා ගැනීම. (<u>ස්ථිරවාසිතාව</u>)

- උඩරංචාමඩමෙන් හමු වූ නිවාසය මීටර 10.20 x 6.80 ප්‍රමාණයෙන් හා ආයත චතුරස්‍රාකාර හැඩයෙන් යුක්ත අත්තිවාරම.

- එම නිවාසයේ ඉදිරිපස හා පිටුපස කොටස් බිත්තියකින් වෙන්කර තිබිණි.

- නිවසේ බිත්ති වරිච්චි මැටියෙන් ද වහල ඉලුක් හෝ එවැනි දෙයකින්ද සෙවිලි කර තිබෙන්නට ඇත.

**ජීවන රටාව**

- කෘෂිකර්මාන්තය ආරම්භ කිරීම.

- උඩරංචාමඩමේදි කණින නිවාසයක තිබී පින්තාරුකළ වළඳකට අයත් කැබලි හමුවිය.

- කැණීමට ලක්කළ නිවාසයේ මුළුතැන්ගෙයි ගල් මෙවලම් හා යකඩ මෙවලම් හමු වී ඇත.

- දඩයම් කරන ලද සතුන්ගේ ඇටකටු ඉතිරි වී තිබීම.

- එකළ විසූ කාන්තාවන් තමන්ගේ රූ සපුව අලංකාර කිරීමට යොදාගත් අපකරණ කිහිපයක් හමුවීම.

**පූර්ව ඓතිහාසි යුගයේ තාක්ෂණය**

- ගල් ආයුධ තාක්ෂණයෙන් කෙමෙන් මිදී ලෝහ තාක්ෂණය හා මැටි බඳුන් නිපදවීමේ තාක්ෂණය වෙත පරිවර්තනය ආරම්භ වීම මේ යුගයේදී සිදු විය.

- සකපෝරුව භාවිත කරමින් මැටි බඳුන්වල තීන්ත ආලේප කිරීම.

- නිවාස ඉදිකිරීම ආරම්භ වූ හෙයින් ඊට අදාළ තාක්ෂණික දැනුම් ක්‍රමයෙන් වර්ධනය වීම.

- පබළු නිපදවීමේ තාක්ෂණය තිබූ බවට උඩරංචාමඩමෙන් සාක්ෂි හමුවීම.

  උදා :- මැටි පබළු, ඇස් අඳුන් ගල්වන ලෝහ කූරක්,

**මුල් ඓතිහාසික යුගයේ ජනාවාස**

මුල් ඓතිහාසික යුගය වශයෙන් සැලකෙන්නේ ක්‍රිස්තු පූර්ව 450 පමණ සිට ක්‍රිස්තු වර්ෂ 300 වන තුරු කාල පරිච්ඡේදයයි.

**මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන සාධක. (භූ භෞතික පසුබිම අනුව)**

- වාර්ෂික වර්ෂාපතන අගය.
- පසේ ස්වභාවය.
- භූ විෂමතාව.
- ස්වභාවික සම්පත් වල ව්‍යාප්තය.
- ජලවහනය.

**මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යුහය හා ස්වරූපය**

- වාපිගාම යුන්වෙන් සාහිත්‍ය මූලාශ්‍රයවල හඳුන්වා දී ඇති වැවක් කේන්ද්‍ර කොටගෙන වර්ධනය වූ ස්වාධීන ජනාවාස ව්‍යාප්ත වීම.

  උදා :- සුමනාවාපිගාම
  විහාරවාපිගාම
  හුන්දරීවාපිගාම
  කඩහවාපිගාම

- එක් ගමක් තවත් ගමකින් කැලෑ තීරයකින් වෙන් වීම.

- නොයෙක් වෘත්තිකයන් විසූ ඇතැම් ජනාවාස පිළිබඳ තොරතුරු පහත සඳහන් ආකාරයට වංශකතාවල හා සෙල්ලිපිවල සඳහන් කොට තිබීම.

  1. කසීකාරගාම - ගොවියන් විසූ ගම්
  2. මණිකාරගාම - මැණික් ගැරූ හෝ කැපූ අය ජීවත් වූ ගම්
  3. ගෝපාලගාම - ගොපල්ලන් විසූ ගම්
  4. කේවට්ටගාම - ධීවරයන් විසූ ගම්
  5. කුම්භකාරගාම - වළං සාදන්නන් විසූ ගම්
  6. වඩ්ඩකීගාම - වඩුවන් විසූ ගම්

- කාර්යයන් පදනම් කරගෙන ක්‍රියාත්මක වූ ගම් වර්ග දක්නට ලැබීම.
  නිදසුන් :-
  7. පට්ඨානගාම - වරාය ආශ්‍රිතව තිබූ ගම්
  8. නියම් ගම් - වෙළඳ ගම්
  9. ඔළගම් - ජනතාව විසින් අත්හැර දැමූ වැව් ගම්

- නිවාස වරිච්චි බිත්ති වලින් හා කොළ අතු පියස්සකින් සමන්විත වූ අතර ඒවායේ බිම් සැලැස්ම වටකුරු හෝ හතරැස් විය.

  උදා :- තිස්සමහාරාම වලගම්ලත්තුව පුරාණ නිවාස, අනුරාධපුර පැරණි ඇතුළු නුවර පැල්පතකට අයත් කණු වලවල්.

- ගම් සහා ක්‍රමය පිහිටා තිබුණි

  උදා :- මාගම

  වැටකින් ආරක්ෂිත ගම් - පරික්ඛිත්ත ගම්
  වැටකින් අනාරක්ෂිත ගම් - අපරික්ඛිත ගම්
  විශාල නාගරික ජනාවාස - පුරනුරුපුර - අනුරාධපුර - 1 විජයබාහු - පනාකඩුව තඹ සන්නස
  ගම සහ පුරය අතර ජනාවාස (අතරමැදි) - නකර
  නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා - පුරකමත

- ජනාවාසවල සංවිධානය පරිපාලනය ක්‍රමවත්

  පවුලේ ප්‍රධානියා - ගෘහපති (ගහපති)

**මුල් ඓතිහාසික යුගයේ වැසියන්ගේ යැපීම් ක්‍රම**

- ප්‍රධාන යැපීම් ක්‍රමය හේන් ගොවිතැන විය.

- කුරක්කන් , මෙනේරි , තල සහ තණහාල් වැනි කටුසර බෝග ඒවායේ වගා කෙරිණි.
  (නියගයට ඔරොත්තු දේ)

- කෘෂිකර්මාන්තය

# ඇගයීම 2

පහත සඳහන් ප්‍රශ්නසඳහා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන තුළ ලියන්න.

01. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් ලැබී ඇති පතිරාජවෙල ප්‍රදේශයේ ඉරණමඩු සැකැස්මට අයත් බොරළු තට්ටුව කාල නිර්ණය අනුව වසර , ........................................................ පැරණිය.

02. ලංකාවේ යකඩ භාවිතය පිළිබඳව මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ ................................................................ යුගයේදිය.

03. ශ්‍රී ලංකාවට පැමිණි නූතන මානවයා සේ සැලකෙන්නේ ................................................................. ය.

04. ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වු ................................................................. වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානයකි.

05. අතීතයේදී වරාය ආශ්‍රිතව තිබූ ගම්මාන ................................................................. ලෙස හඳුන්වයි.

පහත සඳහන් ප්‍රශ්නසඳහා පිළිතුරු ලියන්න.

06. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප 3 ක් නම් කරන්න.

07. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වුයේ යැයි සැලකෙන වෙරලාශ්‍රිත එළිමහන් වාසස්ථාන පැවති ස්ථාන දෙකක් සහ ගල් ගුහා වාසස්ථාන පැවති ස්ථාන දෙකක් නම් කරන්න.

# 03. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම

ජනසම්මතයෙන් පාලක බලය හිමි කරගන්නා රජෙකු හෝ රැජිනක් විසින් පාලනය කරන භූමි ප්‍රදේශයක් එම පාලනයට සහභාගි වන විවිධාකාර නිලධාරි පිරිසක් , ජනතාවත් රාජ්‍යය යන නමින් හැඳින්වේ.

**<u>පූර්ව රාජ්‍ය සමය</u>**

- රාජ්‍යයක් බිහිවීමට පෙර ශ්‍රී ලංකාවේ රට පාලනය කිරීමට අදාළව පැවති ස්වරූපය පූර්ව රාජ්‍ය සමය ලෙස හැඳින්වේ.
- පූර්ව රාජ්‍ය සමයේදී මෙරට පාලනය කිරීමට එක් නිශ්චිත පාලකයකු සිටියේ නැත.
- වත් පොහොත්සක්මි ඇති ප්‍රභූන් පිරිසක් විසින් කුඩා ප්‍රදේශ වල සිය බලය පවත්වාගෙන ගිය අතර ඔවුන් සෙල් ලිපි වල පරුමක යන නමින් හඳුන්වා ඇත.

**<u>ගෘහපතියෝ</u>** :- ( පවුලේ ප්‍රධානියා ) - උදා : අනුරාධපුර පෙරියපුලියන්කුලම සෙල්ලිපිය

- පවුල යන අදහස දීමට පැරණි කාලයේ භාවිතා වූයේ 'කුල' යන පදයයි.
- මෙම සෑම පවුලකම ප්‍රධානියා ගෘහපති නමින් හඳුන්වා දී ඇත. (ගහපති)
  ගහපතියන් ඉටුකළ කාර්යයන් :- පොදු කටයුතු වලදී පවුල නියෝජනය, පවුලේ කාර්යයන් ඉටුකරලීම.

**<u>ගම්කයෝ</u>** :- (ග්‍රාමික)

- පැරණි සෙල්ලිපි වල මෙන්ම අටුවා කථාවල <u>"ග්‍රාමික"</u> හෝ <u>"ගමික"</u> යන නමින් හඳුන්වා දී ඇත්තේ පැරණි ගම්වල ජීවත් වූ ගම් ප්‍රධානීන් ය.
- ගමක් නියෝජනය කිරීමට නායකයකු තෝරා ගන්නා ලද්දේ ගෘහපතීන් අතරිනි. ඔවුන් ධනවත්ය, බලවත්ය - උදා :- හම්බන්තොට සිතුල්පව්ව සෙල්ලිපිය. (ගමික සිව, ගමික සුමන, ගමික තිදන)
- ගමිකයන් ගෘහපතියන් අතරින්ම පත් වූ කෙනෙකු බව <u>බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත සමන්තපාසාදිකාවේ</u> සඳහන් කර තිබේ.
- ගම් - අපේ ගම, අල්ලපු ගම, පිටගම් ලෙස වර්ග විය.
- ගමිකයන් ඉටු කළ කාර්යයන්,
  - ඒ ඒ ගම්වල පොදු කටයුතු වලට නායකත්වය දීම.
  - ගමට අයත් වැව් නඩත්තු කිරීම.
  - වැවෙන් ජලය බෙදා හැරීම.
  - ගම්වල පැවති ආරවුල් විසඳීම.

**<u>පරුමකවරුන්</u>** :- (කොට බොජක / තිර්ථය අනුභව කරන්නා - (ප්‍රාදේශිය පාලක)

උදා :- පොචනි රජ - මාතලේ ඇඹුල් ඇඹේ සෙල්ලිපිය.
දූහතර රජ - යටගහලෙන විහාර සෙල්ලිපිය.

- පරුමක යන වචනය සෑදී අත්තේ සංස්කෘත භාෂාවේ "ප්‍රමුඛ" යන පදයෙනි.

- මොවුන් කුඩා ප්‍රදේශ වල බලය පවත්වාගෙන යන ලද අතර ඔවුන්ට එවැනි බලයක් හිමිවූයේ ඔවුන් ධනවත් වීමත් ඒ නිසාම හිමි වූ බලවත්කමත් නිසාය.

- ඇතැම් අවස්ථාවල කාන්තාවන් ද ප්‍රාදේශිය පාලනයට හවුල් වී ඇති අතර ඔවුන් "පරුමකලු" නම් විය.

- පරුමකවරුන්ගේ බිහි වීම පුරාණ කාලයේ වැව් නඩත්තු කිරීම හා සම්බන්ධ බව විද්වතුන්ගේ පිළිගැනීමයි.

- පරුමකවරු "රජ" නමින් ද හඳුන්වා ඇත. (සතුටුකරන්නා)

<u>**රාජ්‍යන්ගේ වර්ධනය.**</u>

- රාජ්‍යත්වයේ වර්ධනය යනු විකේන්ද්‍රගතව තිබූ බලය මධ්‍යගත වීමයි.

- එනම්, බලය එක් පුද්ගලයකුගේ අණසක යටතට පත් වීමයි.

- බලය මධ්‍යගත වීමෙන් රාජ්‍යය යන යාන්ත්‍රණය නිර්මාණය වේ. එහි පාලන ප්‍රධානියා රජු ය.

- ශ්‍රී ලංකාවේ පැරණි සමාජය තුළ විමධ්‍යගතව තිබූ දේශපාලන බලය මධ්‍යගත කළ රජවරුන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

  - පණ්ඩුකාභය රජු ප්‍රාදේශිය පාලකයන් කිප දෙනෙකු (මාමාවරුන්) හා සටන් කොට ඒ ප්‍රදේශ අත්පත් කරමින් රජ බවට පත්වීම.
    පාලන මධ්‍යස්ථානය - අනුරාධපුරය. රාජ්‍යත්වයේ දසවන රාජවර්ෂයේ දිවයිනේ ග්‍රාමසීමා නියම කරන ලදි.
    නාගරික ලක්ෂණ ඇති කිරීම.

  - දේවානම්පියතිස්ස (දෙවනපිය) රජ සමයේ දේශපාලන බලය මධ්‍යලත වීමේ අවහ්‍යතාව තවදුරටත් වර්ධනය වීම. හේතුව - ඉන්දිය සාගරයේ වෙළදාම
    බුදු දහම රාජ්‍ය ආගම කිරීම, ජය ශ්‍රී මහා බෝදියේ පරිවාර බෝධීන් ප්‍රාදේශිය පාලකයන්ට ලබා දිම.

  - දුටුගැමුණු රජු රට එක් සේසත් කිරීම. (ප්‍රථමයා), (පරුමකවරුන් යොදා ගැනීම.
    මාතොට වරාය එළාරගෙන් නිදහස් කර ගැනීම. ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරය. රජසැප පිණිස නොව බුදු සසුනේ චිරස්ථිතියට කටයුතු කිරීම. රාජතාන්ත්‍රිකව කටයුතු කිරීම. සහනශිලි ආකල්ප. උදා - රුවන්වැලිසෑය ඉදිකිරීමේදි සතර දොරටුවේ දන්සැල්, වැටුප් ) / රුවන්වැලි මහා සෑය සඳහා භාතිකාභය රජු රෝමයට තානාපතිවරයකු යවා පබළු ගෙන්වීම.

  - වසභ රජු - (ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා) දිස්ත්‍රික් පාලනයට ඇමතිවරු පත්කිරීම. උදා :- යාපන පාලක සෘෂිගිරි ඇමති (වල්ලිපුරම් රන්පත). පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීම තම දරුවන් පත්කිරීම. මහ වැව් ඉදිකිරීමේ ප්‍රමුඛයා - වැව් 11. බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය. භික්ෂුන්ට සිව්පසයෙන් සංග්‍රහ කිරීම රජයේ බදු අයකිරීම ක්‍රමවත් කිරීම.
    මහ වැව් ඉදිකිරීමට හේතු :- දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණා ගංගා නිම්නයේ ඇති වූ ආහාර හිගය හේතුවෙන්. වැව් - මහවිලච්චිය වැව, මානන්කට්ටිය වැව, නොච්චියාගාන වැව, හිරිමඩුන්න වැව.

  - පළමු විජයභාහු රජ - (කිත්ති පනාකඩුව තඹ සන්නස-උපහාර-සිත්නාරුබිම. බුදල්නාට) චෝලයින්ගෙන් රට නිදහස් කර ගැනීම. රටම එක්සේසත් කරවීම. පොලොන්නරුව මධ්‍යස්ථානය කර ගැනීම. චෝල පාලකයන්ගෙන් රජරට බේරා ගැනීම. රට එක්සේසත් කළේ ඉන්දියන් සාගරයේ අන්තර්ජාතික වෙළදාම නැගෙනහිර ඉන්දියානු සාගර කලාපයට මාරු වීම නිසාය.
    පොලොන්නරුව පාලක මධ්‍යස්ථානය විමට හේතු - ගෝකණ්නතිත්ත (ත්‍රිකුණාමලය) වරායට ආසන්න වීම නිසාය.

## රාජ්‍යත්ව සංකල්පය

- රජවරුන්ගේ ක්‍රියා කලාපය සහ පෙනී සිටීමට උත්සාහ කළ ස්වරූපය අනුව රාජ්‍යත්වය පිළිබඳ විවිධ සංකල්ප ගොඩ නැගී ඇත.

- ඒ අනුව දේවත්ව (නරඉසෙර-නරයින්ට ඊශ්වර-කුටකණ්ණ අභය රජ. දඹුලු විහාරයේ පර්වත ලිපිය. මහසෙන් රජ - මින්නේරිය දෙවියන් ) , බෝධිසත්ව , පර්වතරාජ සිරිසඟබෝ රජු, I වන කාශ්‍යප රජ (අලකපය මහරජ), වීරත්ව (දුටුගැමුණු රජු) සහ චක්‍රවර්ති - සක්විති (නිශ්ශංකමල්ල රජ-කාලිංග චක්‍රවර්ති) වැනි සංකල්ප රජවරුන්ට ආරෝපනය විය.

## රාජ්‍ය උරුමය

- සහෝදරයාගෙන් සහෝදරයාට - දේවානම්පියතිස්ස - දුටුගැමුණු - සද්ධාතිස්ස

- පියාගෙන් පසු පුතාට - කාවන්තිස්ස රජ- දුටුගැමුණු රජු- මුටසිව රජු- දේවානම්පියතිස්ස රජු

පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය අරුමය ලැබුණු ආකාරය විමසා බැදිමේදි එය සහෝදරයාගෙන් සහෝදරයාට හෝ පියාගෙන් පසු පුතාට හෝ හිමි වී ඇත.

## රාජ්‍ය තන්ත්‍රය

ශ්‍රී ලංකාවේ දේශපාලනය බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත් වූ නිලධාරීන් තන්ත්‍රයේ ව්‍යුහය.

මහරජ ( මපුරුමුකා )

↓ මහ ඇමති ( මහමත ) | ↓ භාණ්ඩාගාරික

මහ ඇමති ( මහමත )

↓

ඇමතිවරු ( අමෙත ) + සේනාපතිවරු ( ශෙනපති )

↓

භාණ්ඩාගාරික ( බඩගරික )

↓

භෝජනාශාලා අධිකාරී ( බතගු )

↓

චත් සිරිත් හා චාරිත්‍ර පිළිබඳ අධිකාරී ( කොතුරුගදනා )

↓

නාගර පාලක ( නගර ගුතික )

↓

නාගරික වාස්තුවිද්‍යාඥ ( නගර විඩික ) + අශ්ව අංශයේ ප්‍රධානී ( අස අදෙක ) + ඇත් අංශයේ ප්‍රධානී ( හති අදෙක ) + නාට්‍ය අංශයේ ප්‍රධානී ( නට අදෙක ) + කාසි අච්චු ගැසීමේ අංශයේ ප්‍රධානී ( රූප අදෙක ) + වෙළඳ කටයුතු භාර ප්‍රධානී ( පන අදෙක ) + රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී ( කනපෙඩික )

# ඇගයීම 3

01. පරුමකවරුන්ට රජයේ ඉහළ තනතුරු ලබා දී දේශපාලන බලය මධ්‍යලත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ රජතුමා කවුරුන්ද ?

02. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා තමාගේ ශිලා ලිපි බෙහොමයක ම භාවිත කළ රාජ්‍යත්වය පිළිබඳ සංකල්පය කුමක්ද ?

03. පවුලක ප්‍රධානියා හැඳින්වීම සඳහා ශිලා ලිපි වල භාවිතා කළ නාමය කුමක්ද ?

04. සිය දසවන රාජ්‍ය වර්ෂයේදී මෙරට ග්‍රාමසීමා ලකුණු කළ පාලකයා කවුරුන්ද ?

05. ශ්‍රී ලාංකිය තානාපතිවකු රෝමයට දූත ගමණක් යැවූ රජතුමා නම් කරන්න.

06. මෙරට ශිලාලිපි වල සඳහන් තොරතුරු වලට අනුව පහත පුද්ගලයන්ගේ තනතුරු නාම ලියන්න.

1) ගමක ප්‍රධානියා

2) ගම් කිහිපයක හෝ වැව් පද්ධතියක ප්‍රධානියා

07. මධ්‍යම පාලනයට සම්බන්ධ පහත සඳහන් කාර්ය භාර වූ තැනැත්තන්ගේ නිල නාම මොනවාදැයි වරහන් තුළින් තෝරා ලියන්න.

A - ඇමති මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම. ..................................................

B - රාජ්‍ය භාණ්ඩාගාරය සම්බන්ධව කටයුතු කිරීම. ..................................................

C - නගරයේ පාලනය සම්බන්ධව කටයුතු කිරීම. ..................................................

D - රජුගේ ඇතුන් සම්බන්ධව කටයුතු කිරීම. ..................................................

( වෙදනා , මහමත , බඩගරික , ශෙනපති , හති අදෙක , නගරගුතික , අස අදෙක , බතගු )

08. පහත දැක්වෙන ස්ථාන ශ්‍රී ලංකා සිතියමක ලකුණු කොට නම් කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අලිගල, | 2. | යොතාන | 3. | පිදුරංගල |
| 4. | අත්තනගොඩ අළුලෙන | 5. | කිතුල්ගල බෙලි ලෙන | 6. | මානියම්ගම |
| 7. | පාහියන්ගල | 8. | රාවනා ඇල්ල | 9. | මිනිහාගල්කන්ද |
| 10. | බුන්දල | 11. | අලුගල්ගේ | 12. | උඩමළල |
| 13. | දියවින්න | 14. | එළිෆන්ට්පාස් | 15. | පුන්කරි |

# 04 ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

අපේ රටේ ඉතිවිහාසය තේරුම් ගැනිමට නම් පුරාණ කාලයේ විසූ පාලකයන් , රජයේ නිලධාරීන් , ආගමික පුජකයන් සහ වෙනත් ප්‍රභූන් මෙන්ම සාමාන්‍ය ජනතාවගේ ද ජීවිතය ගැන ඉගෙනීම අවශ්‍ය වේ.

**<u>පාලනයේ ස්වරූපය.</u>**

- පුරාණ කාලයේ අප රට රජවරුන් පාලනය කල බව ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වේ.

- ඕනෑම රටක පාලනය මෙහෙයවන ආයතන 3 ක් ඇත. එය ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය වේ.

  ව්‍යවස්ථාදායකය - නීති සම්පාදනය කරන ආයතනය, විධායකය - නීති ක්‍රියාත්මක කරන ආයතනය අධිකරණය යුක්තිය පසිඳලනු ලබයි.

- පුරාණ කාලයේ අප රටේ විධායකයක් සහ අධිකරණයක් තිබූ අතර ව්‍යවස්ථාදායකය ලෙස ක්‍රියාත්මක වූයේ ද විධායකයයි.

- මෙරට රාජාණ්ඩු ක්‍රමයක් පැවති බැවින් ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ලෙස වෙනම ස්වාධීන ආයතනයක් එකල නොවීය.

- ක්‍රි. ව. 9 වන සියවසේදී විධායකකය සහ ව්‍යවස්ථාදායකය හැඳින්වීමට "එක්තැන්සමිය" යන යෙදුම සෙල්ලිපිවල සඳහන් වේ. (බුද්ධන්නේහෙල සෙල්ලිපිය)

- අධිකරණය යන අර්ථයෙන් සමහර සෙල්ලිපිවල "සභාව" යන පදය යෙදී ඇත.

- රජයේ ලේඛනගත කවටයුතු සඳහා මහලේකම්වරයෙකු සිටි අතර ඔහු "මහලේ" (මැදිරිගිය සෙල්ලිපිය) නමින් හදුන්වා ඇත.

- මෙකල රටේ ප්‍රධාන පාලක මධ්‍යස්ථානය වූ අනුරාධපුරයෙන් බැහැරව පළාත් පාලනය සඳහා රජයට සම්බන්ධ වෙනම පරිපාලන ඒකක තිබී ඇත. (වල්ලිපුරම් රන්පත)

- ක්‍රි. ව. 9 වන සියවසේ පැවති ප්‍රාදේශිය මට්ටමේ පරිපාලන මණ්ඩල සෙල්ලිපිවල හඳුන්වාදී ඇත්තේ "දසගම් ඇත්තන්" යනුවෙනි. (කළුදියපොකුණ සෙල්ලිපිය)

- පරිපාලනයේදී රටේ ජනතාවගේ සුභ සිද්ධිය පතා කටයුතු කිරීමට පාලකයෝ කටයුතු කර ඇත.

- වෛද්‍යවරු හා රෝහල් ඉදිකිරීමට රජවරු කටයුතු කර ඇත.
  රෝහල් - වෙජ්ජසාලා (සාහිත්‍ය මූලාශ්‍රය) වෙජ - වෛද්‍යවරු - බුද්ධදාස රජු - රෝහල් ඉදිකිරීම, V මහින්ද - රෝහල් වලට අවශ්‍ය දේවල් IV කාශ්‍යප රජු - උයසග්ගරෝගනාස (දරුණු උණ රෝගයට ප්‍රතිකාර කිරීමට) I උපතිස්ස රජු - මාතෘ නිවාස (පසවත්තිනාම සාලා) පණ්ඩුකාභය රජු ජ් පොත්තසාල (ආගමික ගොඩනැගිල්ල)

- බුද්ධිමත් රජවරු තමන්ගේ අසල්වැසි රටවල් සමග මෙන්ම ඇතැම් අවස්ථාවල ඈත රටවල් සමග ද ඉතා සුහදශීලි සබඳතාවයකින් කටයුතු කර ඇත.

- අසල්වාසී රටවල ප්‍රජාව දෙස විශ්වාසවන්ත ලෙස කටයුතු කිරීම අපේ පැරණි පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තිය තුළ කැපී පෙනෙන කරුණක් විම.
  I ගජබාහු රජු චේර රාජ්‍යයට ගොස් ඇත. (පත්තිනි දේවාලයක් විවෘත) භාගිනාභය රජු රෝමානුක ප්‍රදේශයට දූතයන් යැවීම. I වන විජයබාහු රජු කාලිංග තිලෝකසුණු දළදා මාලිගයේ ආරක්ෂාවට වේලෙක්කාර හමුදාව පත් කිරිම. අල් කලසූරිය ලංකාව රතුකැට දිවයින ලෙස හඳුන්වා තිබීම.

**<u>පුරාණ කාලයේදී මෙරට පැවති පාලනයේ මූලික අරමුණු.</u>**

- ❑ රටවැසියා අතර සාමකාමී සහජීවනයක් ඇති කිරීම.
- ❑ ඔවුන්ගේ සුභ සාධනය සැලසීම.
- ❑ මව්බිමේ සුරක්ෂිතතාව සහ රටවැසියාගේ අනාගත චිරජීවනය උදෙසා භූමියේ අඛණ්ඩත්වය ආරක්ෂා කිරීම.
- ❑ අසල්වැසි රටවල් සමග සුහද ව අවබෝධයෙන් කටයුතු කිරීම.

**<u>පුරාණ ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික ක්‍රම.</u>**

කෘෂිකර්මාන්තය → හේන් ගොවිතැන
කෘෂිකර්මාන්තය → වී ගොවිතැන
කෘෂිකර්මාන්තය → සත්ත්ව පාලනය

## 01. ගොවිතැන

**<u>හේන් ගොවිතැන</u>** :-

- ❑ ඓතිහාසික හා පුරා විද්‍යාත්මක මූලාශ්‍රයවලට අනුව මෙරට පැවති පැරණිම ගොවිතැන් ක්‍රමය හේන් ගොවිතැනයි. ඓතිහාසික මූලාශ්‍රය වල 'සොහොන් , පිටබිම්' හඳුන්වා ඇත.
- ❑ මෙහිදී තමන්ගේ වගාවට ප්‍රමාණවත් තරමේ ඉඩම් කොටසක් මහ කැලෑවකින් වෙන් කොට ගෙන එය කපා ගිනි තැබීමෙන් හේනක් සකස් කරගනු ලැබේ. (නවාදැලි හේන)
- ❑ වරක් දෙවරක් වගා කළ හේන් ඉන්පසු අතහැර දමයි.
- ❑ කාලයක් අතහැර දමා නැවත වගා කිරීම ආරම්භකරන හේන් 'කනත්ත' ලෙස භාවිතා කරයි.
- ❑ උඳු , මෑ , මුං , කුරක්කන් , ඉරිඟු , තල , අබ , දුරු , තණහාල් , කරබටු , තිබ්බටු , වම්බොටු , අළුපුහුල් , වට්ටක්කා , අල වර්ග , වී. උක්ගස් සහ කපු මෙහි වගා කොට ඇත.
- ❑ හේනක් වගා කිරීම හේතුවෙන් ඇතැම් රජවරුන්ගේ කාලවල දී බදු අය කරගෙන තිබේ.
  කැති අඩ , කොටු කනබ (නිශ්ශංක රජුගේ සෙල්ලිපිය)

**<u>වී ගොවිතැන</u>** :-

- ❑ සෙල්ලිපිවල වී වගා කරන ලද තැන් හඳුන්වාදී ඇත්තේ "කුඹුර" හා "කෙත " යනුවෙනි.
- ❑ බොහෝ අවස්ථාවල වී වගාව පවත්වාගෙන යන ලද්දේ වාරිමාර්ග භාවිතා කිරීමෙනි.
- ❑ වී වගාව කන්න දෙකකට සිදුකර ඇත. කන්න තුනක් වගා කළ බව යල, මැද, මහ තෝනිගල සෙල් ලිපිය (ශ්‍රී මේඝවර්ණාභය රජු)
- ❑ වැව් තැනීමේ සම්ප්‍රදාය මෙරට දියුණු වුයේ ජලය රැස්කර ගැනීමේ අවශ්‍යතාවය හේතුවෙනි.

**<u>සත්ත්ව පාලනය</u>** :-

- ❑ පැරණි සමාජයේ සත්ත්ව පාලනය අතර ප්‍රධාන වූයේ ගව පාලනයයි.
  කිරිගෙරි - IV කාශ්‍යප රජු
- ❑ ගව පාලනයේ යෙදුණු පිරිස් සඳහාම වෙන් වූ ගෝපාලගම් ගැන සෙල්ලිපිවල සඳහන් වේ.
- ❑ ගවයන් හැරුණු විට කුකුළන් සහ එළිවන් ද මෙකල නිවෙස්වල ඇති කළේය.

**<u>කර්මාන්ත</u>** :-

ලෝහ කර්මාන්තය (යකඩ කර්මාන්තය, තඹ කර්මාන්තය, රන් කර්මාන්තය)
ඇත්දත් කැටයම් කර්මාන්තය
මැටි කර්මාන්තය
රෙදි කර්මාන්තය
මැණික් කර්මාන්තය

- ❑ ලෝහ භාවිතා කරමින් කර්මාන්ත වල යෙදුණු ශිල්පීන් ගැන තොරතුරු මූලාශ්‍රයවල දක්නට තිබේ.
  යකඩ / කම්මල්කරු - කබර , තඹ ලෝහ කර්මාන්තය - තබකර , රන් කරුවන් - තුලාධාර, ස්වර්ණකාර
- ❑ යකඩ වැඩ කළ කම්මල්කරුවන් හැඳින්වීමට සෙල්ලිපිවල "කබර" යන නම යොදා ඇත.
- ❑ තඹ ලෝහයෙන් සහ ටින් ලෝහයෙන් කර්මාන්ත කළ ශිල්පීහුද එකල සිටියහ.
- ❑ "තුලාධාර" යනුවෙන් එකළ විසූ රන්කරුවන් හඳුන්වා ඇත. (මණ්ඩගල සෙල්ලිපිය)
- ❑ මැණික් කර්මාන්තය පැවති බවට සාධක අනුරාධපුර , මාගම පැරණි නගර වල කැණීම් වලදී සොයාගෙන ඇත.
- ❑ ඇත් දත් කැටයම් කලාව (දටික) , මැටි භාණ්ඩ තැනීම (තුබකර) , රෙදි විවීමේ කර්මාන්තය - තතවය(වෙහෙරකෙම සෙල්ලිපිය) වැනි කර්මාන්ත ද අතීතයේදී පැවති බවට සාක්ෂි ලැබී ඇත.

**<u>වෙළඳාම</u>** :-

- ❑ වෙළඳාම පැරණි කාලයේ මෙරට පැවති ප්‍රධාන ජීවන මාර්ගයක් විය.
- ❑ වෙළඳ කටයුතු රට ඇතුළත මෙන්ම රටින් පිටත වෙනත් දේශ සමග ද පැවතිණි.
- ❑ වෙළඳාමේ නියුක්ත වූ පිරිස් එකළ හඳුන්වන ලද්දේ "වානිජ" හෝ "වාපර" යන නමිනි.
- ❑ නගර හෝ ගම් ආශ්‍රිතව භාණ්ඩ වෙළඳපොලවල් පැවතුණි.
- ❑ අන්තර්ජාතික වෙළඳ කටයුතු වලදී ශ්‍රී ලංකාව වැදගත් වැඩ කොටසක් අතීතයේ සිටම ඉටු කර ඇත.

<u>අන්තර්ජාතික වෙළඳාමේදී ශ්‍රී ලංකාව වැදගත් වීම</u>

- ❑ ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම.
- ❑ ස්වාභාවික වරායන් පිහිටා තිබීම. (මාතොට, ගෝකණ්නතිත්ත, ගොඩවාය, ජම්බුකෝලපට්ටන - ශ්‍රී මහා බෝධිය වැඩමවීම, ලංකාපට්ටන - දන්තධාතුව වැඩමවීම)
- ❑ අන්තර්ජාතික වෙළඳාම නිසා අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීම.

- අබල වපර - ආමිල ව්‍යාපාරය - සියඹලා වෙළෙන්දෙක් (සීගිරියේ සෙල්ලිපියක)
- වෙළඳ සංවිධානයක් - පූගය , නියමස්ථාන
- වෙළඳාමේ නියලුන පිරිස් - වානිජ , වාපර
- වෙළෙන්දන් භික්ෂූන් වහන්සේලාට ලෙන් සකස්කර දීම. (මණ්ඩලගල, වෙහෙරකෙම සෙල්ලිපිය)
- වෙළඳ පොලවල් පාලනය කිරීම - බදුලු ටැම් ලිපිය.
  බදුලු ටැම් ලිපිය, හෝපිටිගමු ටැම්ලිපිය, සොරබොරවැව ටැම්ලිපිය - IV උදය රජු
- වෙළඳ පොළට පැමිණෙන කරත්ත වලින් පමණක් බදු අයකිරීම
- පොහොය දිනවල වෙළඳාම් කරන අයගෙන් දඩ මුදල් අය කිරීම.
- නියමිත මිනුම් කිරුම් ඒකක පමණක් භාවිතා කිරීම.
- දකුණු ඉන්දියානු සම්භවයක් ඇති වෙළඳ සංවිධාන ජ් නානාදේසි, වලක්කදයාර් , අයින්නුරුවර්

# 02. සංස්කෘතිය

**ආගම** :-

- ක්‍රි. පු. තෙවන සියවසයේදි මිහිදු මහ රහතන් වහන්සේ මෙහි වැඩමකොට බුදු දහම දේශනා කිරීමේ පටන් බුදු දහම මෙරට ප්‍රධාන ආගම විය.
- ස්වාභාවික ගල්ගුහා පිරිසිදු කොට ඒවා භික්ෂූන් සඳහා පූජා කොට ඇත.
- ඇතැම් ගල් ගුහා වල කටාරම යටින් එම ගල්ගුහාව පූජා කළ අයගේ විස්තර කොටා ඇත. නිදසුන් :- මිහින්තලේ , රිටිගල , වෙස්සගිරිය , සීගිරිය
- ගුහා විහාර හැරුණු විට "පණ්ණසාලා" නමින් හැඳින්වූ ගොඩනැගිලි විශේෂයක් ගැනද මූලාශ්‍රයවල සඳහන්ය. දීඝ නිකාය - දසභාණක
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන තෙක් එහි කොටස් කටපාඩමෙන් මතකයේ රඳවාගත් භික්ෂූන් වහන්සේලා භාණකවරුන් ලෙස හඳුන්වා ඇත.
- අන්තේවාසික - නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩ වාසය කළ භික්ෂූන් ථෙර - නායක ස්වාමීන් වහන්සේ
  සද්ධිවිහරිය - නායක තෙරුන් වහන්සේ සමීපයේ විසූ භික්ෂූන් වහන්සේ
  වසවසික - වස් වසන ලද , වසවසික සගධක - කඨින චීවරය

**වෙනත් ආගම්** :-

- අනුරාධපුර නගරය සහ එහි අවට හින්දු බ්‍රාහ්මණ ජන කණ්ඩායම් වාසය කොට ඇත. ශිවලිංගය - සොත්තිසාල , සිවිකාසාලා - බ්‍රාහ්මණයින්ගේ ආගමික කටයුත්ත.
- කුරුසයක් සටහන් කළ පැරණි ගල් පුවරුවක් අනුරාධපුරයෙන් සොයාගෙන තිබේ. නෙස්ටෝරියානු කතෝලික නිකායටය
- ක්‍රි. ව. 9 වන සියවසින් පසු කාලයේ ඉස්ලාම් ආගමට අයත් අදහස් ශ්‍රී ලංකාවේ පැවති බව පෙන්වීමට සාක්ෂි තිබේ.
  පැරණිම අරාබි මූලාශ්‍ර - සරන්ඩිබ් , අරාබි ජාතිකයින්ට අයත් පැරණි සොහොන් ගලක කොටා තිබෙන සෙල්ලිපි කියුබාක් අරාබි අක්ෂර

**අධ්‍යාපනය** :-

- පැරණිතම සෙල්ලිපි වල ගුරුවරුන් "අචරිය" යන්නෙන් හඳුන්වා ඇත.
- බුදුදහම මෙරට සමාජයේ මුල්බැස ගැනීමෙන් අනතුරුව ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානය වූයේ බෞද්ධ විහාරාරාමයි.
- පැරණි කාලයේ අනුරාධපුරයේ මහාවිහාරය සහ අභයගිරිය අධ්‍යාපනය ලබා දුන් ආයතනයි. විදේශ ශිෂ්‍යයන් ලංකාවට පැමිනීම - අටුවාචාරී බුද්ධඝෝෂ හිමි
- විවිධ ශිල්පීන් - නැට්ටුවන් (මැදගම සෙල්ලිපිය)
  චිත්‍ර අඳින්නන් - සිත්තරුවන් චිතකර, ලයන

# ඇගයීම 4

පහත සඳහන් ප්‍රශ්නසඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

01. අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතුය යන ප්‍රකාශය කළ වාරි කර්මාන්තයට මහත් සේවයක් කළ පාලකයා වන්නේ,

1. මහා පරාක්‍රමබාහු රජු.
2. මහා විජයබාහු රජු.
3. වසභ රජු.
4. මහසෙන් රජු.

02. අනුරාධපුරය හා ඒ අවට දරුණු අණ රෝගයක් පැතිර ගිය අවස්ථාවේදී ප්‍රතිකාර කිරීම සඳහා විශේෂ රෝහලක් ඉදිකළ පාලකයා වන්නේ,

1. බුද්ධදාස රජු.
2. iv කාශ්‍යප රජු.
3. v මහින්ද රජු
4. නිශ්ශංකමල්ල රජු.

03. අතීත ශ්‍රී ලංකාවේ වගා කන්න තුනක් පැවති බවට සාධක හමුවේ. තුන්වැනි කන්නය වගා කිරීමට තීරණය වූයේ,

1. ගම් නායකයාගේ අභිමතය පරිදිය
2. පසුගිය කන්නයේ ලැබුණු අස්වැන්න මතය.
3. ගොවීන්ගේ උන්නදුව මතය.
4. ජලය ලබා ගැනීමේ හැකියාව පරිදිය.

04. දෙමළ සෙල්ලිපි වල සඳහන් ආකාරයට දහතුන්වන සියවස දක්වා මෙරට ක්‍රියාත්මක වූ දකුණු ඉන්දිය වෙළඳ සංවිධානයක් නොවන්නේ.

1. නානාදේසී
2. වලඤ්ඤියාර්
3. කොංජිවරම්
4. අයින්නුරුවර්

05. අරාබි ජාතිකයින් ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා භාවිතා කළ නාමය,

1. සෙයිලාන්.
2. තප්‍රොබේන්.
3. සරන්ඩිබ්.
4. තම්බපණ්ණිය.

# 05 ශ්‍රී ලංකාවේ පැරණි විද්‍යාව හා තාක්ෂණය

- විද්‍යාව හා තාක්ෂණය යන දෙපදයෙන් අදහස් කරන්නේ ස්වාභාව ධර්මයේ පවතින මූලධර්ම තේරුම් ගැනීමත් ඒ අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය උපාය මාර්ග නිර්මාණය කිරීමත්ය.

- ශ්‍රී ලංකාවේ පැරණි සමාජය තුළ ද විද්‍යාත්මක අදහස් භාවිතයේ පැවතුණි.

**විද්‍යාත්මක අදහස් වල මුල් අවස්ථා**

- ව්‍යවහාරික විද්‍යාවේ මුල් අවස්ථා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පිළිම්මු වන අතර එය කිසියම් පරිණත තත්වයකට පත් වූයේ ඉන් අනතුරුව අදාවන පූර්ව ඓතිහාසික යුගයේ දී ය.

- ගලකින් තවත් ගලකට වැරෙන් පහර දී ගල් පතුරක් ගලවාගෙන එය මෙවලමක් සේ භාවිතය.

- පූර්ව ඓතිහාසික යුගයේ පැවති විද්‍යාත්මක අදහස්වල ස්වරූපය පිළිඹිබු වන අවස්ථා කිහිපයක් මෙසේය.

  1. මැටි ඔරු ආකාරයේ පැරණි සුසාන.
  2. නිවාස ඉදිකිරීමේ තාක්ෂණය.
  3. මැටි බඳුන් තැනීම.

**මැටි ඔරු ආකාරයේ පැරණි සුසාන.**

- මේවා ඉදිකර තිබෙන්නේ මියගිය අය ආදාහනය කිරීමයට.

- අමු මැටි යොදා ගනිමින් විශාල බේසමක හෝ ඔරුවක හැඩයෙන් ඒනා නිර්මාණය කර ඇත.

- සොහෙන් ගර්භයේ බිත්ති අවම උසකින් හා එයට සරිලන ගණකමකින් ද පොළෙවට ලම්බාකාරව බැඳීම තුළින් ද සොහොන් බිත්ති වල සමබරතාව රැක ගැනීමට ඒවා ඉදිකළ අය කල්පනා කර තිබේ.

- මෙහිදි යම්කිසි වස්තුවක් පොළොවට ලම්බාකාර වීමෙන් එම වස්තුව මගින් පොළොව මත ඇති කරන පීඩනය නිශ්ක්‍රිය වේ. යන භෞතික විද්‍යාත්මක මූලධර්මයක් භාවිතා වී ඇත.

- ක්‍රි. පූ. 1350 දී ඉදිකරන ලද මැටිසොහොන් ගර්භයක ඇටසැකිළි පිළිස්සීමේදී ඇතුළට වායුව ලබා ගැනීම සඳහා මැටි නලයක් සවි කර තිබූ අතර මෙහිදී දහනය සඳහා ඔක්සිජන් වායුව අවශ්‍ය වේ යන විද්‍යාත්මක මූල ධර්මය පිළිබඳව එකල වැසියන් අවබෝධ කරගෙන සිටි බව පෙනේ.

**නිවාස ඉදි කිරීමේ තාක්ෂණය**

- කිතුල්ගරැ බෙලි ලෙනෙන් සොයාගෙන ඇති ගල් බැම්ම

- ශ්‍රී ලංකාවේ නිවාස ඉදි කිරීම පිළිබඳව පැහැදිලි සාක්ෂි අපට පෙනෙන්නේ පූර්ව ඓතිහාසික යුගයේදී ය.

- ක්‍රි. පූ. 1129 දී ඉදිකරන ලද එවැනි නිවසක නටබුන් රත්නපුර දිස්ත්‍රික්කයට අයත් උඩරංචාමඩම නම් ගම්මානයකින් හමුවේ.

- පොළොව මත ගල් කැබලි අතුරා සවිමත් කොට ඒ මත මැටි අතුරා එම නිවසේ ගෙබිම ඉදිකර තිබුණි.

- එහි බිත්ති ගොඩනගා ඇත්තේ වරිච්චි බිත්තිවලින්ය.

- නිවසේ ඉදිරිපස හා පිටුපස වශයෙන් කොටස් දෙකක් වෙන් කිරීමට නිවස මැදින් බිත්තියක් ඉදිකර තිබුණි.

- මෙලෙස අත්තිවාරම මත බිත්ති ගොඩනගා ඒ මත වහලක් සවිකර කාලයක් පවතින ලෙස නිවසක් ඉදිකිරීමට එකල ජනයා සතුව තාක්ෂණික දැනුමක් තිබූ බව පෙනේ.

**මැටි බඳුන් තැනීම.**

- මැටි බඳුන් තැනීමේ තාක්ෂණය පිළිබඳ පැහැදිලි සාක්ෂි අපට පූර්ව ඓතිහාසික යුගයේදී හමුවේ.

- ඒ කාලයේ සකපෝරුව වැනි සරල යන්ත්‍රයක් මැටි බඳුන් තැනීමට භාවිතා කර තිබේ. උඩරංචාමඩම නිවාසයෙන් හමු වූ පාට කරන ලද මැටි බඳුන.

- භාජනයක් සෑදීමට සුදුසු මැටි වර්ග සොයා ගැනීම , ඒවා පදම් කර ගැනීම , පිළිස්සීමට උදුනක් තනා ගැනීම , නියමිත උෂ්ණත්වයට බඳුන පුළුස්සා ගැනීම ආදි ප්‍රායෝගික පියවර කිහිපයක් පිළිබඳ මනා දැනුමක් මෙහිදී වුවමනා වේ.

- එමෙන්ම මේ යුගයේ හමු වන <u>කාල රක්ත මැටි බඳුන්</u> තැනීමේදී ඇතුළත කළු පැහැයත් , පිටත රතු පැහැයත් ඇතිවන පරිදි ඒවා නිමවීමට විශේෂ තාක්ෂණික ක්‍රම යොදා ගෙන ඇත.

- මීට අමතරව පිළිස්සූ මැටි බඳුන් මතුපිට ඔප දැමීම වර්ණ ගැන්වීම ආදි තාක්ෂණයද එකල පැවතිණි.

**විද්‍යාත්මක භාවිතයේ පරිණතිය.**

විද්‍යාවේ හා තාක්ෂණයේ පරිණත ලක්ෂණ පෙන්වන අවස්ථා ඓතිහාසික යුගයේදී අපට දැක ගැනීමට ලැබේ. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

1. ජල කළමණාකරණය හා සම්බන්ධ ඉදිකිරීම්වල දී
2. වාස්තු විද්‍යාත්මක නිර්මාණවල දී
3. දේශිය චත්සිරිත්වල දී
4. දේශිය දැනුම භාවිතයේදී

<u>ජල කළමණාකරනය</u>

අතීතයේදී වියළි කලාපයේ ජනයාට ඔවුන්ගේ එදිනෙදා ජීවන අවශ්‍යතා හා ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීම අභියෝගයක් විය.

වැව් පද්ධතිය - වැව් ප්‍රපතනය වියළි කලාපයේ ගැමියන් හැඳින්වූයේ වැව් එල්ලංගාම

මෙරට වැව් , පොකුණු යන ඇළ මාර්ග තැනීමේ අවශ්‍යතාව ඇති වූයේ එම තත්වය පදනම් කරගෙනය.

ජලය රැස්කර ගැනීම සඳහා අනුගමනය කළ කවර උපක්‍රමයක් වුවද ජල කළමනාකරණය යනුවෙන් හඳුන්වයි.

**<u>මහවැව් තැනීම</u>**

කෘෂිකාර්මික කටයුතු සඳහා ,
ගංවතුර පාලනය කිරීමට ,
නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතා

- මෙරට ඓතිහාසික යුගයට අයත් විශිෂ්ට කටයුක්තත් ලෙස මහවැව් තැනවීම පෙන්වාදිය හැකිය.

- විශාල ප්‍රමාණයේ වැව් තැනීම ඉතා සංකීර්ණ විද්‍යාත්මක දැනුමක් සහිත තාක්ෂණික උත්සාහයකි. අනුරාධපුර යුගයේදී ද එවැනි විශාල වැව් තනා නඩත්තු කර ඇත.
නිදසුන් :- කවුඩුල්ල වැව , මින්නේරිය වැව , හුරුළු වැව , කලා වැව , පදවිය වැව

**වැව් බැම්ම** :-

- විශාල ජල ධාරිතාවක් රඳවා ගැනිම සඳහා වැව් බැම්ම ඉදිකිරීමේදි ගිලා බැසිම වැළැක්විමට පිහිටි ගලක් තෝරාගෙන ඒ මත වැව් බැම්ම ඉදිකොට ඇත.

- ස්වභාවිකව පිහිටි කඳු දෙකක් අතර තැනක තිබෙන ගලක් සොයාගෙන ඒ මත වැව් බැම්ම නිර්මාණය කර ඇත.

- වැව් බැම්මේ ස්ථායිතාව ආරක්ෂා කර ගැනීම සඳහා එහි දැඩි බව අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා වැව් බැම්ම තැනීමේදි පස් තට්ටු කිහිපයක් යොදා ගැනීම.
  සීගිරි මහ වැව් බැම්ම

- යෝධ වැව - වැව් බැම්ම සැතපුම් 7 ක් දිගය

**රළපනාව** :-

- වැවක් ජලයෙන් පිරි තිබෙන විට ජල තරංග හේතුවෙන් වැව් බැම්ම ඛාදනය විමකට ලක්වේ. මෙය වැලැක්විම සඳහා වැව් බැම්මෙහි ඇතුළත බෑවුමෙහි ගල් ඇතිරීමෙන් රළපනාව තනා තිබේ.

**සොරොව්ව** :-

- විශාල වැව් වලින් ජලය පිටතට ගැනීම සඳහා සෙරොව්ව තනා තිබේ.

- විශාල ගල් පතුරු උපයෝගි කරගනිමින් වැව් බැම්මේ නිශ්චිත උස් මට්ටමක සොරොව්ව සවිකර ඇත.
  වෙස්සගිරිය සෙල්ලිපිය - මොහොල් ගග - දියකැට පහන

- බිසෝ කොටුවද සොරොව්වේ එක් අංගයකි. එය වැවෙන් ජලය පිටතට ගලා එන ගලින් තැනූ ආයත චතුරස්‍රාකාර අවකාශයකි. වැවක පහලම මට්ටමේ තිබෙන්නේ මඩ සොරොව්වයි.

- සොරොව්වක් ඉදිකිරිමටත් එය පරිහරණය කිරිහටත් විද්‍යාත්මක දැනුමක් අවශ්‍ය වේ.
  මාදුරු ඔයේ සොරොව්ව.

**ඇළ මාර්ග** :-

- ගංගා හරස්කර අමුණක් බැඳ ජලය රැස්කර ගැනිමත් එසේ රැස් කරගත් ජලය වැව් වෙත ගෙනයාමත් ඇළ මාර්ග ඔස්සේ සිදු විය.

- අව්ක - ඇළ මාර්ග ඉදිකිරිම සම්බන්ධ නිලධාරියා.

- මෙය ඉතා ඈත කාලයක සිට ජල කළමනාකරණයට අදාලව අපේ රටේ පැවති තාක්ෂණයකි. මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන් ගග හරස් කර ඉදිකළ ඇළහැර ඇළ අතිතයේ කළ දැවැන්ත කාර්යයකි.
  මෙමගින් මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, කන්තලේ වැව් වලට ජලය.

**පොකුණු** :-

බෞද්ධ විහාරාරාම වල විසූ භික්ෂුන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා පොකුණු ඉදිකිරීම අපේ අටේ පැවති ජල කළමනාකරණයට අදාළ තවත් අංගයකි.

නිදසුන් :- කුට්ටම් පොකුණ , කුමාර පොකුණ , නෙළුම් පොකුණ , ඇත් පොකුණ

**ඌරා කැට ළිං** :-

- වියළි කලාපීය ප්‍රදේශ වල පානීය ජලයේ ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම සඳහා මෙම ළිං තනා ඇත.
- මෙහිදී විශාල ප්‍රමාණයේ මැටි බදුන් කිහිපයක් ළිඳ තුළට බස්සවා එහි බිත්ති ආවරණය කිරීම සිදු කර ඇත.

**සීගිරයේ ජල මල්** :-

- සීගිරියේ ජල මල් බටහිර උද්‍යානයේ දක්නට ලැබෙන විශිෂ්ටතම නිර්මාණයකි.
- ඉහළ සිට පැමිණෙන ජලය එක් ස්ථානයකින් හිර කොට ජල පීඩනයක් ඇතිකර ජල මල් ස්වභාවිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

**වාස්තු විද්‍යාව**

පැරණි වාස්තු විද්‍යාව පිළිබඳ අංග රැසක් අනුරාධපුර හා පොළොන්නරුව රාජධානිවල නටඹුන් පරීක්ෂා කිරීමේදී අපට හමු වේ.

**ගෘහ නිර්මාණ** :-

- දාගැබ් , බෝධිඝර , පිළිම ගෙවල් , විහාර ගෙවල් , ආරාම , දානශාලා , භාවනා කුටි , රජමාලිගා , බලකොටු , බෙහෙත් ශාලා යන ගෘහ නිර්මාණ මේ යටතේ පෙන්වා දිය හැකිය.
- ජේතවනය , අභයගිරිය , රුවන්වැලිසෑය  වැනි විශාල ස්තූප තැනීමේදී දියුණු විද්‍යාත්මක දැනුමක් හා තාක්ෂණයක් යොදාගෙන ඇත.
- අකුණුසැර වැනි ස්වාභාවික ආපදා වලින් ස්තූපය ආරක්ෂා කර ගැනීම සඳහා රුවන්වැලි සෑය මුදුනේ වජ්‍ර චුම්බට නම් අකුණු සන්නායකය සවිකර තිබේ.
- රුවන්වැලි සෑයේ අත්තිවාරම සැකසීමේදී දැවැන්ත ගඩොල් ස්තූපයේ බර දරා ගැනීමට හැකි වන පරිදි නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමවේදයක් භාවිත කර ඇත.

**නගර නිර්මාණය හා උද්‍යාන නිර්මාණය**

- සීගිරියේ නාගරික සැලැස්ම සහ එහි තිබෙන උද්‍යාන සංකීර්ණය මේ සඳහා හොඳම නිදසුනයි.
- විධිමත් ලෙස සැලසුම් කරන ලද ගණිතානුකූල ආකෘතියකට එය නිර්මාණය කොට ඇත.

**සනීපාරක්ෂාව , ස්වස්ථතාව හා වෛද්‍ය ක්‍රමය.**

- පණ්ඩුකාභය රජුගේ පාලන කාලයේදී අනුරාධපුරයේ ඉදිකොට තිබූ මාතෘ නිවාස (සිවිකා සාලා) ගැන මහා වංසයේ සඳහන් වේ.
- පොළොන්නරුව ආලාහන පිරිවෙන භූමියේ කළ කැණීම්වලදී පැරණි රෝහලක නටබුන් හා සංකීර්ණ ශල්‍යකර්ම සඳහා භාවිතා කරන ලද මෙවලම් හමු වී ඇත.
- දැනට ශේෂව ඇති වැසිකිළි කැසිකිළි නටබුන් වලින් පැරැන්නන්ගේ අපද්‍රව්‍ය කලමනාකරනය පිළිබඳ අවබෝධය පෙනී යයි.

**<u>පුරාණ යකඩ නිස්සාරණ තාක්ෂණය</u>**

- බෙරගල සොහොන් ගැබකින් යබොර කැබැල්ලක් හමුවීම.
- බලංගොඩ සමනලවැව ප්‍රදේශයෙන් හා සීගිරියට නුදුරු අලකොළ වැව දෙහිගහ ඇළකන්ද නම් ප්‍රදේශයෙන් පැරණි යකඩ උඳුන් සොයාගෙන ඇත.
- ඒ අනුව සමනලවැව ප්‍රදේශයේදී යකඩ නිස්සාරණය කළ අඳුන් දැල්වීමට ස්වාභාවික සුළං බලය හා මරං දැව අඟුරු යොදාගෙන ඇත.
- දෙහිගහ ඇළකන්ද යකඩ උදුන් දැල්වීමට අවශ්‍ය සුළං මයින හමක් භාවිතා කර ඇත.
- ආභරණ සැකසීමේ තාක්ෂණය ජේතවනාරාමයෙන් හමු වූ රන් ආභරණ කැබැල්ල.

**<u>දේශීය චාරිත්‍ර</u>**

- කෘෂිකාර්මික අවශ්‍යතා වෙනුවෙන් පැරණි ජනයා විවිධ යාතුකාර්මික පුද පූජා වෙත නැඹුරු වූ බවට සාධක ඇත.
- මී තෙල් , තල තෙල් වැනි තෙල් වර්ග යොදා ගනිමින් කෘමි උවදුරු , හරකුන්ට වැළඳෙන ඇතැම් රෝග නිවාරණය කිරීමට කෙම් පහන් ක්‍රම අනුගමනය කිරීමට අපේ පැරැන්නන් යොමු වී ඇත.
- ගල්යාය ප්‍රදේශයෙන් දේවාලයක නටබුන් සොයා ගැනීම, එහි කිරිමඩු ශාන්තිකර්මය පවත්වා ඇති බවට විශ්වාස කෙරේ.

**<u>දේශීය දැනුම.</u>**

කිසියම් සමාජයක වාදාත්මක දැනුමක් පවතින බව විදහා පාන එක් දර්ශකයක් වන්නේ ස්වභාව ධර්මයට අයත් භෞතික තත්වය මැන ගැනීමට සමත් ක්‍රමවේදයක් පැවතීමයි. අපේ පැරණි මිම් ඊට නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය.

**<u>අවකාශය මැනීම.</u>**

අවකාශය මැන ගැනීමට අපේ පැරැන්නන්ට අවශ්‍ය වුයේ ගොවිතැන් සඳහා ඉඩම් භාවිත කිරීමේ දිය. අවකාශය මැනීම සඳහා මෙරට පැගන්නන් විසින් යොදාගෙන තිබෙන්නේ පරිමාව මැනීමට අදාළ ඒකක යි. - කිරිය , අමුණ , කරිසය , පැල

කරිසය - දුනුමඩලාකන්ද සෙල්ලිපිය, හොරිවිල සෙල්ලිපිය

| | | | | |
|---|---|---|---|---|
| ලාහ | 40 | = | පැල | 1 |
| පැල | 12 | = | කුරුණි | 12 |
| කුරුණි | 44 | = | අමුණු | 1 |
| අමුණු | 1 | = | කරිස | 0.25 |

**<u>දිග මැනීම.</u>**

- දිග මැන ගැනීමට ද පැරණි කාලයේ ක්‍රමවත් මිම් පද්ධතියක් භාවිතා කර ඇත. එහි කුඩා ම ඒකකය වුයේ පරමාණුවයි.

| | | | | |
|---|---|---|---|---|
| පරමාණු | 36 | = | අණු | 1 |
| අණු | 36 | = | තජ්ජාරි | 1 |
| තජ්ජාරි | 36 | = | රථරේණු | 1 |
| රථරේණු | 36 | = | ලික්ඛ | 1 |
| ලික්ඛ | 7 | = | උක්ව | 1 |
| උක්ව | 7 | = | ධඤ්ඤමාස | 1 |
| ධඤ්ඤමාස | 7 | = | ආංගුල | 1 |
| ආංගුල | 12 | = | වියත් | 1 |

**<u>බර මැනීම</u>** :-

- බර මැනීමට ද එකල විධිමත් ඒකක පැවතිණි
- පුරාණ කාලයේ මෙරට භාවිතා වූ බර මැනීමේ මිණුම් ක්‍රම

| | | | | |
|---|---|---|---|---|
| පිළ | 4 | = | ගුන්ජා | 1 |
| ගුන්ජා | 2 | = | මායක | 1 |
| මායක | 2.5 | = | අක | 1 |
| අක | 8 | = | ධරණ | 1 |
| ධරණ | 5 | = | ස්වර්ණ | 1 |
| ස්වර්ණ | 2 | = | පල | 1 |

**<u>කාලය මැනීම</u>** :-

මාස 12 - වස 1
වස = හවජර - අවුරුදු = තිවිය
තත (තිවිය) - රජගල සෙල්ලිපිය.

- දිගු කාලයක් මැන ගැනීමට වර්ෂය යන අදහස භාවිත විය. එය චන්ද්‍රයාගේ ගමන අනුව පදනම් වූ මාස ක්‍රමයකට සකස් වූවකි.
- දිනයක් සෑදී ඇත්තේ මුහුර්ථ වලිනි. මුහුර්ත = මොහොත
- දැදිගම ඇත් පහන. ප්‍රංචගාම - දැදිගම සුතිඝර චෛත්‍ය අසල I වන පරාක්‍රමබාහු රජු ඉපදුනු ස්ථානය සිහිපත් කිරීමට.
    - පහනට අවශ්‍ය තෙල් ඇතාගේ උදරයේ ගබඩාකර ඇත.
    - පහනේ තෙල් අඩුවන විට උදරයේ ඇති තෙල් පහනට වැටේ.
    - නූතන විද්‍යාව තුළ අවල ජල විද්‍යාවට මෙය අයත් වේ.

# ඇගයීම 5

01. සැලසුම , තාක්ෂණය හා අලංකාරය යන කරුණු අතින් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම නාගරික උද්‍යානය ලෙස සැළකෙන උද්‍යානය කුමක්ද ?

02. පැරණි යකඩ නිස්සාරණ කර්මාන්ත පිළිබඳ සාක්ෂි හමු වී ඇති ස්ථාන දෙකක් නම් කරන්න.

03. අනුරාධපුර නගරයට ජලය සැපයීම සඳහා ඉදිකරන්නට ඇතැයි සැලකෙන වැව් දෙකක් නම් කරන්න.

04. භික්ෂුන් වහන්සේලා සඳහා ඉදි කළ පොකුණු දෙකක් නම් කරන්න.

05. පහත දැක්වෙන පැරණි තාක්ෂණය හා සම්බන්ධ නිර්මාණ මොනවාදැයි වරහන් තුළින් තෝරා ලියන්න.

A - මැටි බඳුන් සැකසීම සඳහා යොදා ගත් තාක්ෂණික නිර්මාණය.

B - ජල පීඩනය සමනය කොට ඇළට ජලය නිකුත් කිරීමට භාවිත කළ තාක්ෂණික නිර්මාණය.

C - ස්ථිතික ජල විද්‍යා මූලධර්මය භාවිතා කොට කරන ලද නිර්මාණය

( රළ පනාව , බිසෝ කොටුව , දුණු - ඊතල , සකපෝරුව , ගිලා මෙවලම් , ඇදිගම ඇත් පහන , පිටවාන , කටාරම )

# 06 ඓතිහාසික දැනුම සහ එහි ප්‍රායෝගික ආදේශනය

සමාජයක් යනු පුද්ගල එකතුවකි එකට එකතු වී සිටින පුද්ගලයන් අතර එක්තරා ආකාරයකට ගොඩනැගුණු සම්බන්ධතාවන්ගේ සංකලනයක් සමාජයක දැකිය හැකිය. ලෝකයේ විවිධ රටවල පවතින සංස්කෘතික හා පරිසර තත්වයන් අනුව එක් එක් සමාජයන් එකිනෙකට වෙනස් වේ. මේ නිසා ලෝක ව්‍යාප්ත ඒ ඒ සමාජ තුළ ජීවත් වූ මිනිසුන් ලද අත්දැකීම් මත එකිනෙකට වෙනස් දැනුම් පද්ධතියක් නිර්මාණය වී තිබීම දක්නට ලැබේ. සමාජයක් මගින් මෙලෙස තනනු ලබන දැනුමට විවිධාකාරයේ පැතිකඩ අයත් විය හැකිය.

මෙලෙස අතීත සමාජයක ජීවත් වූ මුතුන් මිත්තන් විසින් නිපදවන ලද විශිෂ්ට දැනුම වර්තමානයේ ජීවත් වන්නන්ට ලැබුණු වටිනා දායාදයකි. ඒ මන්ද අතීත දැනුම තුළින් වර්තමාන සමාජයට බොහෝ ආදර්ශ , අත්දැකීම් ලබාගත හැකි නිසාය.

මෙම පාඩම තුළින් ඔබට අපේ පැරනි ලාංකික ජන සමාජය තුළ භාවිතයේ පැවති ඓතිහාසික දැනුමේ පැතිකඩ කිහිපයක් පමණක් සාකච්ඡාවට බඳුන් කර ඇත.


### ඓතිහාසික යුගයේ සමාජ සංවිධානය

ලංකාවේ පැරණි පාලකයින් රටේ සමාජය මනාව සංවිධානය කොට ස්ථාවරව පවත්වාගෙන ගොස් ඇත.

ලංකාව තුළ අතීත පාලනයේ ප්‍රධානියා රජු වූ අතර පාලන කටයුතු වලදී රජුට අවශ්‍ය විවිධ සේවා සපයන හා පාලන කටයුතු මෙහෙයවන විශාල රාජ්‍ය නිලධාරීන් පිරිසක් සිටියේය.

ඒ අනුව,

- රජුගේ සිට පහලට සිටි නිලධාරීන් සිරස් ධුරාවලිය
- සමාන තනතුරු දරන්නන්ගෙන් සමන්විත ධුරාවලිය තිරස් ධුරාවලිය ලෙස හඳුන්වයි.




- අතීතයේ රජුට ඉතා සමීපව කටයුතු කළ රාජ්‍ය සේවකයින් රද්කොල් සමිදරු ( රාජකුල ස්වාමිදරු ) යනුවෙන් හඳුන්වා තිබුණි.

- මහා සංඝරත්නය සමාජයේ ඉහළින් සිටි පිරිසක් වූ අතර පාලන කටයුතු වලට අවශ්‍ය අනුශාසනා ලබා දෙන ලදි.

- සමාජයේ බහුතර කොටස සමාන්‍ය ජනතාවගෙන් සමන්විත වූ අතර පොදුවේ මෙම සාමාන්‍ය ජනතාව සෙල්ලිපිවල කුඩීන් යන නමින් හඳුන්වනු ලබයි.

- සාමාන්‍ය ජනතාව හා ඉහළ සමාජ ප්‍රභූන් අතර සම්බන්ධීකරණය ගොඩනැගීම සිදු කරනු ලැබුවේ රාජ්‍ය නිලධාරීන් විසිනි.

- සමාජයේ පහළම මට්ටම නියෝජනය කරනු ලැබුවේ දාසයින් වන අතර දාසයෝ වර්ග 02 කි එනම් ,
    1. පාරම්පරික දාසයන් ( අන්වයාතදාස )
    2. කුලියට ලබාගත හැකි දාසයන් ( ධනක්කීතදාස )

## නීතිය හා සම්ප්‍රදාය

නීතිය

ලිඛිත නීති


අලිඛිත නීති
(සම්ප්‍රදායානුකූල නීති )

අතීතයේ ,

- නීති සම්පාදනය කිරීම ව්‍යවස්ථාදායකය - වදාළ → රාජ සභාව
- නීති නායාමනය කිරීම → ආරක්ෂක නිලධාරින් (දණ්ඩනායක-මෙකාප්පර් )
- නීති විනිශ්දය කිරීම. අධිකරණය → සභාව

අතීත පාලකයින් විසින්,

- වැව් පරිපාලනය.
- රජයේ ඉඩම් පරිහරණය.
- කෘෂිකාර්මික කටයුතු.
- විදේශ වලින් භාණ්ඩ ආනයනය කිරීම.
- ස්වභාවික පරිසරයට සතුන් , ගහකොළ , ජලය , පස ආදි දෑ ආරක්ෂා කිරීම.
- වෙළදාම හා වෙළඳපොලවල් පාලනය.
- අපරාධ කටයුතු.
- සතුන් නොමැරීම.




සම්බන්ධයෙන් නීතිරීති පනවා ක්‍රියාත්මක කොට ඒවා නිලධාරීන් යොදවා විනිශ්චය කොට ඇත.

- බදු නීති හා වෙනත් නීති උල්ලංගනය කරන්නන් හට දඬුවම් නියම කිරීම අතීතයේ උසාවි ( මහාධිකරණ ) ක්‍රියාත්මක වී තිබුණි. I වන ගජබාහු රජු - සිතුල්පව්ව සෙල්ලිපිය

- අතිතයේ රේගු බදු අයකළ වරායකි - ගොඩවාය වරාය

- නිසි කලට සීසෑම නොකරන පුද්ගලයින්ට කළ පහක දඩයක් නියම කිරීම. - I වන කාශ්‍යප රජුගේ කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය.
- කෘෂිකාර්මික කටයුතු මැනවින් පවත්වාගෙන යෑමට අදාළ ප්‍රතිපත්ති ආරක්ෂා කර ගැනීම - IV වන මහින්ද රජුගේ අනුරාධපුර වෙස්සගිරිය ලිපිය.

- වෙළඳාම් වලදි සිදුවිය හැකි අකටයුතුකම් වංචා වැලැක්වීම. (හෝපිටිගම වෙළඳපොල හා සම්බන්ධව) - IV වන උදය රජුගේ සොරබොරවැව් ටැම් ලිපිය (බදුලු ටැම් ලිපිය)

- මී හරකුන් , එළ හරකුන් සහ එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැනවීම - IV වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපිය.

- සොරකම් කිරීම , මිනී මැරීම ආදි වරදවල් සඳහා දිය යුතු දඬුවම් - IV වන මිහිඳු රජුගේ වේවැල්කැටිය ලිපිය.

- ගෘහදණ්ඩ ජ් අපරාධකරු අල්ලා ගන්නා තුරු ඔහු ජිවත් වූ ගමේ වැසියන් රාජ්‍යයට බද්දක් ගෙවිය යුතුය.

## මුදල් සහ විනිමය

- පැරණි යුගයේ ආර්ථිකය
  - මුලින්ම → භාණ්ඩ හුවමාරු ක්‍රමය
  - පසුව → මුදල් භාවිතය

- පැරණි හස්එබු කාසිය, - රිදී කාසිය
  සෙල්ලිපි වල ⟶ කහාපණ කාර්යාපණ
  සාහිත්‍ය කෘතිවල ⟶ කහවණු

- මෙරට නිපද වූ හමුවී ඇති මුල්ම කාසිය අලියා හා ස්වස්තිකය සහිත කාසියයි.

- පැරණි සෙල්ලිපිවල කාසි අච්චු ගැනීමේ කටයුක්ත භාරව සිටින්නා ⟶ රූපදක

- ලංකාවෙන් හමුවන විදේශ කාසි →
  - රෝම කාසි
  - චීන කාසි
  - අරාබි කාසි
  - බ්‍රිතාන්‍ය කාසි

## කාන්තා නියෝජනය

- මෙරට පාලන කටයුතු වලට සහභාගි වූ කාන්තාවන්
  උදා :- චූලසීවලි මහ රැජින
  ලීලාවතී රැජින

- අතිතයේ භික්ෂුන්ගේ ගෞරවාදරයට පත් කාන්තාවන් (කාන්තාව ගෞරවයට පත්වූයේ මව්වරුන් ලෙසය) උදා :- විහාරමහා දේවිය

- සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් හැදින්වූයේ - මධුපාචිකා , මධුරහත්තරසා
  උදා :- අශෝකමාලා

- ප්‍රාදේශිය පාලන කටයුතු වල නැයැලි සිටි කාන්තාවන් හැදින්වූයේ - පරුමකලු

- අතිතයේ කාන්තාවන් තම රූ සපුව ආරක්ෂා කර ගනිමින් අලංකාරව සිටි බවට සාක්ෂි හමුවන්නේ, - උඩරංචාමඩම

## දේශීය ආහාර

අතිතයේ මිනිසුන් ආහාර වල පෝෂණ ගුණයට හානියක් නොවන ලෙස සකසා ගෙන ආහාර ගෙන ඇත.

| ආහාරයට ගත් ධාන්‍ය වර්ග | ආහාරයට ගත් අල වර්ග | ආහාරයට ගත් එළවළු වර්ග | ආහාරය රස ගැන්වීමට යොදාගත් කුළු බඩු | ආහාරයට ගත් කැඳ වර්ග | ආහාර පිසීමට යොදා ගත් තෙල් වර්ග |
|---|---|---|---|---|---|
| වී | වැල් අල | වැටකොළු | ලූණු | දියකැඳ | දුන්තෙල් |
| කුරක්කන් | කුකුළල | තම්පලා | දුරු | යවාගු | ගිතෙල් |
| උඳු | කටු අල | වැරණිය දළු | අබ | උළුකැඳ | පොල්තෙල් |
| මුං | කොඩල | කරකොළ | මිරිස් | ඇඹුල්කැඳ | |
| තල | බතල | ලූනුවිල | උළුහාල් | | |
| මෑ | | ලබු | කොත්තමල්ලි | | |
| අමු | | පුහුල් | ගොරකා | | |
| මෙනේරි | | කරබටු | | | |
| කොංගු | | කැකිරි | | | |
| වරු | | මුරුංගා | | | |
| යව | | තිබ්බටු | | | |

- ❑ වී, උඳු, මුං සහ තල ගැන සඳහන්වීම - තෝණිගල සෙල්ලිපිය
- ❑ සහල් පිටි පල්කර සාදා ගන්නා ඇඹුල - කාඩි ඇඹුල
- ❑ ධාන්‍ය වර්ග බැද කුඩු කොට සාදා ගන්නා ආහාරය - අත්සුණු
- ❑ දියාරු නොවූ අතින් ගෙන අනුභව කළ හැකි පදමට සකස් කරගත් ව්‍යංජන - නියඹලාව
- ❑ ව්‍යංජන රසවත් කිරීමට යෙදූ කුළුබඩු - කටුක භාණ්ඩ
- ❑ පැරණි පොත්වල කරපිංචා හැඳින්වූ නාමය - කරබේඹිය
- ❑ ආහාර පිසීමට යොදා ගන්නා තෙල් - කන තෙල්
- ❑ වැව් වල සිට කුඹුරු කරා විහිදෙන කුඩා ඇළ මාර්ග වල මාළු ඇල්ලීම වෙනුවෙන් රජය අය කළ බද්ද - මාත්‍රික මත්ස්‍ය භාගය

## පරිසරය ආරක්ෂා කර ගැනීම

ගහකොළ සතා සිවුපාවුන් ඇතුලු සමස්ත පරිසරය සංරක්ෂණය කිරීමට අවශ්‍ය නීතිරීති පවත්වාගෙන යමින් අතීත ජනයා ස්වාභාවික පරිසරය සමග බද්ධ වී ජීවිතය ගෙන ගොස් තිබේ.

- ❑ උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට නියෝග කිරීම — IV වන මිහිඳු රජුගේ අනුරාධපුර පුවරු ලිපිය
- ❑ කැලෑවල ගස් කොලන් නොකැපිය යුතු බව — III වන උදය රජුගේ බුද්ධන්නෙහෙල ලිපිය
- ❑ ගස්කොළන් කළමණාකරණයේ දී රජය විසින් පනවා තිබෙන නීතිරීති වලට අනුකූලව ක්‍රියා කරන ලෙස රජයේ නිලධාරීන්ට උපදෙස් දීම — V වන කාශ්‍යප රජුගේ කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය

# 07. වියළි කලාපයේ පැරණි නගර පිරිහීම හා නව රාජධානි බිහිවීම.

වියළි කලාපයේ වගර බිහිවීමට පදනම වැටුණු අන්දම.

- ගොවිතැන පදනම් කොටගෙන සමාජ ස්ථිරභාවය හේතුවෙන් ගම් බිහිවීම.
- නිෂ්පාදන අතිරික්තයක් ඇතිවීම.
- ගමට නායකයකු බිහිවීම.
- සමාජ ස්ථාරායනය බිහිවීම.
- අන්තර්ජාතික වශයෙන් වෙළඳ කටයුතු කිරීම.
- ධනවතුන් සුඛෝපභෝගි ජීවිතයකට පෙළඹීම.

> නගරයක් යනු,
>
> වීදි , වෙළඳපොළවල් , යාතු කර්ම සඳහා අවශ්‍ය ගොඩනැගිලි , සෞන්දර්යාත්මක උද්‍යාන , ආරක්ෂක ප්‍රාකාර සහ ජලාශ වලින් සමන්විත ජනාවාසයක්.

- බ්‍රාහ්මීය ශිලා ලේඛන වල වගර හැඳින්වූයේ ⟶ නකර
- ලංකාවේ ප්‍රථම අගනගරය ⟶ අනුරාධපුරය
- අනුරාධපුර නගරය සැලසුම් සහගත නගරයක් බවට පත් කළේ ⟶ පණ්ඩුකාභය රජු
- අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා ⟶ V වන මිහිඳු රජු
- ලංකාවේ දෙවන අගනගරය ⟶ පොළොන්නරුව
- පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කරගත් මෙරට ප්‍රථම පාලකයා ⟶ I වන විජයබාහු රජු

**පැරණි නගර බිඳවැටීමට හේතු**

- සතුරු ආක්‍රමණ
- පාලන තන්ත්‍රය බිඳ වැටීම
- වෙළඳාම බිඳ වැටීම හා වෙළඳ කටයුතු උදෙසා රටවල් අතර පැවති තරගය.
- ජන සංක්‍රමණය.

**පොළොන්නරුව බිඳ වැටීමට හේතු**

- දුර්වල පාලකයින් බලයට පත්වීම.
- කාලිංග හා පාණ්ඩ්‍ය වංශික අරගලය.
- ආර්ථික පරිහානිය.
- කාලිංග මාඝ ගේ ආක්‍රමණය
- වානිජ භෝග සඳහා ඉල්ලුම වැඩිවීම.

පොළොන්නරුව රාජධානිය බිඳවැටීමට ආසන්නතම හේතුව ⟶ වර්ෂ 1215 කාලිංග මාඝ ආක්‍රමණය

**දෙවන නාගරීකරණය යටතේ වර්ධනය වූ නගර.**

- දඹදෙණිය - II පරාක්‍රමබාහු රජු
- යාපහුව - I බුවනෙකබාහු රජු
- කුරුණෑගල - II බුවනෙකබාහු රජු
- ගම්පොළ - IV බුවනෙකබාහු රජු
- කෝට්ටේ - VI පරාක්‍රමබාහු රජු

**දෙවන නාගරීකරණය ඇතිවීමට පදනම් වූ සාධක**

- ❑ දේශපාලන බලය විමද්‍යගත වීම නිසා පාලන මධ්‍යස්ථාන කිහිපයක් සමකාලීනව ක්‍රියාත්මක වීම.
- ❑ නව වරායන් වර්ධනය වීම.
- ❑ සාහිත්‍යයේ ප්‍රබෝධයක් ඇතිවීම.
- ❑ වෙළඳාම පුළුල් වීම.

කාලිංග මාඝ ආක්‍රමණයෙන් පසුව රටේ විවිධ ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ ස්වදේශිය නායකයන්

| | |
|---|---|
| ❑ දඹදෙනිය | වන්නි විජයබාහු |
| ❑ යාපහුව | සුභ සෙන්පතියා |
| ❑ මිනිපේ | සංඛ සෙනෙවියා |
| ❑ ගෝවින්දමලය | බුවනෙකබාහු ආදිපාදවරයා |

**දඹදෙණිය රාජධානියේ රජවරු**

III වන විජයබාහු රජු ⟶ බුවනෙකබාහු (බාලපුත්‍ර)

↓

II වන පරාක්‍රමබාහු රජු ⟶ පියාගෙන් පසුව රජ විය

**III වන විජයබාහු රජු ගේ සේවය**

- ❑ මායා රටේ සතුරන් පලවාහාර මායා රට එක්සත් කිරීම.
- ❑ දඹදෙණිය කේද්‍ර කරගෙන බලයට පත්වීම.
- ❑ කොත්මලයට ගෙනගොස් තිබූ දළදා වහන්සේ දඹදෙණියට වැඩමවා බෙලිගල දළදා මාළිගාවක් ඉදිකර එහි තැන්පත් කිරීම.
- ❑ දඹදෙණියේ විජේසුන්දරාරාමය නමින් විහාරයක් කරවීම.
- ❑ කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කිරීම.

**II වන පරාක්‍රමබාහු රජුගේ සේවය**

**රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග**

- ❑ ලංකාව සතුරු ආක්‍රමණ වලින් මුදවා ගැනීම.
- ❑ රටේ ජන ජීවිතය යතා තත්වයට පත් කිරීම.
- ❑ ආගමික හා අධ්‍යාපනික උන්නතියට කටයුතු කිරීම.

**කාර්යභාරය**

- ❑ රජු උගත් පඬිවරයකු වූ නිසා කලිකාල සර්වඥ පණ්ඩිත යන නමින් හඳුන්වයි.
- ❑ 1247 චන්ද්‍රභානුගේ ආක්‍රමණය පලවාහැරීම.
- ❑ රජරට කාලිංග මාඝ ගෙන් මුදවා ගැනීම.
- ❑ 1261 නැවත සිදු වූ චන්ද්‍රබාහු ආක්‍රමණයට මුහුණ දී ජය ගැනීම.

**යාපහුව රාජධානියේ රජවරු**

දෙවන පරාක්‍රමබාහු රජුගේ පුත් විජයබාහු → IV වන විජයබාහු රජු

IV වන විජයබාහු රජු → පුතා - පරාක්‍රමබාහු

IV වන විජයබාහු රජු → සහෝදරයා

IV වන විජයබාහු රජු ↓ I වන බුවනෙකබාහු

පුතා - II බුවනෙකබාහු → I වන බුවනෙකබාහු

I වන බුවනෙකබාහු → සහෝදරයා

I වන බුවනෙකබාහු ↓ III වන පරාක්‍රමබාහු

**I වන බුවනෙකබාහු**

- විදේශ ආක්‍රමණ වලට සාර්ථකව මුහුණදීම
  උදා :- කාලිංගරායර - චෝඩංග ආක්‍රමණය
- විදේශ සම්බන්ධතා පැවැත්වීම.

**කුරුණෑගල රජවරු**

II වන බුවනෙකබාහු රජු
↓
IV වන පරාක්‍රමබාහු රජු
↓
III වන බුවනෙකබාහු රජු
↓
IV වන විජයබාහු රජු

**කුරුණෑගල යුගයේ ශාස්ත්‍රීය වශයෙන් සිදු වූ විශේෂ සිදුවීම්.**

- ශාස්ත්‍රීය අංශයේ ප්‍රගමනය සිදුවීම
- පන්සිය පනස් ජාතකය සිංහලයට පරිවර්තනය විම.

## ගම්පොළ රාජධානිය

- ආරම්භකයා → IV වන බුවනෙකබාහු රජු

**සමකාලිනය පැවති රාජ්‍යයන්හි පාලකයින්**

- දැදිගම → V වන බුවනෙකබාහු රජු
- යාපනය → ආර්යචක්‍රවර්ති පරපුර
- රයිගම → අලකේෂ්වර

**මෙම රාජධානි සමයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ හා සිදුවීම්**

- ප්‍රභූ පවුල් 02 ක් රජ පවුල සමග සමීප සම්බන්ධතා පැවැත්වීම.
- මාතෘ මූලික රාජ්‍ය උරුම ක්‍රමයක් තිබීම.
- ඉබන් බතූතාගේ පැමිණීම.
- අලකේෂ්වර හා ආර්යචක්‍රවර්ති අතර ගැටුම් සිදුවීම.
- චින ආක්‍රමණය

## කෝට්ටේ රාජධානිය.

- ආරම්භකයා ⟶ VI වන පරාක්‍රමබාහු රජු

සේවය,

- වන්නි ප්‍රදේශ කෝට්ටේ යටතට ගැනීම.
- සපුමල් කුමරා මගින් යාපනය ජය ගැනීම.
- උඩරට ජෝතිය සිටුගේ කැරැල්ල මැඩ පැවැත්වීම.
- රට අවසාන වරට එක් සේසත් කිරීම.
- අධ්‍යාපනයේ හා ශාස්ත්‍රයේ උන්නතිය සිදුකිරීම.

**යාපනය හා වන්නියාර්වරු**

- යාපන ප්‍රදේශය පදනම්කොටගෙන බිහිවිය.
- ආරම්භකයා ⟶ විජය කුලංකෙ (ආර්යවක්‍රවර්ති පෙළපතක)

  අවසාන පාලකයා සංකිලි රජු
- මධ්‍ය පාලනය බිඳ වැටීමෙන් පසුව මධ්‍ය පාලනයෙන් නිදහස්ව ප්‍රාදේශිය වශයෙන් ස්වාධින රාජ්‍ය.
- වන්නි ප්‍රදේශය මෙහෙය වූ ප්‍රාදේශිය නායකයින් ⟶ වන්නියාර්වරුන්

දෙවන නාගරීකරණය යටතේ ආර්ථික , ආගමික හා කලාව සහ ගෘහනිර්මාණ අංශ වල දක්නට ලැබුණු වෙනස්කම්

| අංශ | දෙවන නාගරීකරණය |
|---|---|
| ආර්ථිකය | ප්‍රධාන වගාව වී වගාවට යොමු වූ අතර හේන් ගොවිතැන සිදුවිය.<br>වානිජ භෝග ආර්ථිකයක් ඇතිවීම.<br>නව භූගෝලිය පරිසරයකට හුරු වී අහස් දිය කෙරෙහි පමණක් බලාපොරොත්තු වී ගොවි කටයුතු කළහ.<br>ක්‍රමයෙන් වානිජ ආර්ථික රටාවකට නැඹුරුවූහ.<br>ආර්ථික භෝග - කුරුඳු , පුවක්, ගම්මිරිස්, එනසාල්, සාදික්කා<br>භාණ්ඩ - මුතු මැණික්<br>විදේශ වෙළඳාම පවත්වාගත් රටවල් - ඉන්දියාව, අරාබිය, චීනය, පර්සියාව |
| ආගම | බුදු දහම වර්ධනය වුවද දෙවියන් කෙරෙහි භක්තියෙන් හා විශ්වාසයෙන් කටයුතු කිරීම.<br>දළදා මන්දිර නිර්මාණය විය.<br>විහාරස්ථාන ආශ්‍රිතව දේවාල ඉදිවීම හා දේවාල ආශ්‍රිතව විහාරස්ථාන ඉදිවීම සිදුවිය.<br>දෙවිවරුන් - උපුල්වන්, විබීෂණ, ස්කන්ධකුමාර, සමන් දෙවිවරු |

| | |
|---|---|
| කලාව හා ගෘහනිර්මාණ | ගෘහ නිර්මාණ සඳහා දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පීය ආභාෂය ලැබීම.<br>දඹදෙණි යුගයේ ගද්‍ය සාහිත්‍යයේ උන්නතිය ද කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍යයේ විශාල ප්‍රබෝදයක් ද ඇතිවිය. |
| සංස්කෘතිය | මෙරට නිර්මාණ සඳහා විදේශ ආභාෂයන් ලබා ඇත.<br>උදා :- පාණ්ඩ්‍ය, කාම්බෝජය, දකුණු ඉන්දියාව |
| භාෂාව හා සහිත්‍යය | දඹදෙණිය - II වන පරාක්‍රමබාහු රජු, ධර්මසේන හිමියන්, බුද්ධපුත්‍ර හිමි , පොත්පත් - කව්සිළුමිණ, සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය, සිදත් සගරාව<br>කුරුණෑගල - පන්සිය පනස් ජාතක පොත, දළදා සිරිත, දළදා පූජාවලිය.<br>ගම්පොළ - මයුර හා තිසර සංදේශය, පාරමී ශතකය, බාලාවතාර<br>කෝට්ටේ - රාහුල හිමි, වනරතන හිමි, වෑත්තෑවේ හිමි.<br>හංස, ගිරා, පරෙවි සංදේශ, ගුත්තිල කාව්‍ය<br>පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන, කුරගල පද්මාවති පිරිවෙන, දෙවිනුවරඉරගල්තුලතිලකය, කොටගමුවේ විජයබා පිරිවෙන. |

1 වන නාගරීකරණය යටතේ වර්ධනය වූ නගර හා 2 වන නාගරීකරණය යටතේ වර්ධනය වූ නගර සසඳන විට පෙනෙන ප්‍රධාන විශේෂතා.

| 1 වන නාගරීකරණය යටතේ වර්ධනය වූ නගර | 2 වන නාගරීකරණය යටතේ වර්ධනය වූ නගර |
|---|---|
| විධිමත් ලෙස ජ්‍යාමිතික සැලසුමකින් යුක්තව නිර්මාණය කිරීම | ජ්‍යාමිතික සැලසුමකින් තොරව නිදහස් ස්වරූපයෙන් නිර්මාණය කිරීම |
| මහා පරිමාණ ස්වරූපයක් ගනී | විශාල නගර නොවීම |

# 08. මහනුවර රාජධානිය.

ආරම්භය හා ව්‍යාප්තිය.

- ස්වභාවික ආරක්ෂිතය
  ගිරි දුර්ග , ජල දුර්ග , වන දුර්ග වලින් සමන්විතය
- ආරම්භකයා සේනාසම්මත වික්‍රමබාහු රජු

මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිතා කළ නම්.

- මලය දේශය
- කන්දෙ නුවර.
- සෙංකඩගල රාජධානිය.
- උඩරට රාජධානිය.
- කන්ද උඩරට රාජධානිය.

මහනුවර රාජධානියේ රජවරු.

- සේනාසම්මත වික්‍රමබාහු රජු.
- ජයවීර බණ්ඩාර රජු.
- කරලියැද්දේ බණ්ඩාර රජු.
- I වන විමලධර්මසූරිය රජු.
- සෙනරත් රජු.
- දෙවන රාජසිංහ රජු.
- දෙවන විමලධර්මසූරිය රජු.
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු.
- ශ්‍රී විජය රාජසිංහ රජු.
- කීර්ති ශ්‍රී රාජසිංහ රජු.
- රාජාධිරාජසිංහ රජු
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

(ශ්‍රී විජය රාජසිංහ රජු සිට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා) නායක්කාර් රාජ වංශික රජවරු

I වන විමලධර්මසූරිය රජුට තිබූ අභියෝග

- නීත්‍යානුකූල රාජ්‍ය උරුමයක් නොතිබීම.
- උඩරට සීතාවක බලපෑමෙන් මුදාගත යුතු වීම.
- උඩරට පෘතුගීසීන්ගෙන් බේරා ගැනීම.
  1954 දන්තුරේ සටන ජය ගැනීම. පහතරට ඇතිවන කැරලි වලට සහය වීම.
  පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසීන් සමග සම්බන්ධතා
- පරිහානියට පත් බුදු සසුන නගා සිටුවීම.
- මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණු කළ යුතු වීම.

නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට ගත් පියවර

- කුසුමාසන දේවිය විවාහ කොට ගෙන රාජ්‍ය උරුමය තයවුරු කර ගැනීම.
- රෝමානු කතෝලික ආගම අතහැර බුදු දහම වැළඳ ගැනීම.
- විමලධර්මසූරිය නමින් බෞද්ධ නමක් ලබා ගැනීම.
- දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතුව මහනුවරට වැඩම කරවීම.

බුදු දහම නගා සිටුවීමට ගත් පියවර

- ❑ දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතුව මහනුවරට වැඩම කරවීම.
- ❑ බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම.
- ❑ ලංකාතිලකය , රිදී විහාරය , ගඩලාදෙනිය ප්‍රතිසංස්කරණය කිරීම.
- ❑ රෝමානු කතෝලික ආගම අතහැර බුදු දහම වැළඳ ගැනීම.
- ❑ විමලධර්මසූරිය නමින් බෞද්ධ නමක් ලබා ගැනීම.

ආර්ථික දියුණුවට ගත් පියවර

- ❑ ගොවිතැන් දියුණු කිරීමට කටයුතු කිරීම.
- ❑ කපු වගාව දියුණු කිරීමට අනුබල දීම.
- ❑ කොත්මලේ , වලපනේ යන ප්‍රදේශයේ යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම.
- ❑ උඩරට ආශ්‍රිත වෙඩි ලුණු කර්මාන්තයේ දියුණුවට පියවර ගැනීම.

සෙනරත් රජු

- ❑ 1604 දී රජු විය.
- ❑ කුසුමාසන දේවිය විවාහ කොටගෙන රාජ උරුමය තහවුරු කර ගැනීම.
- ❑ 1630 රන්දෙණිවල සටන ජය ගැනීම.
- ❑ සෙනරත් රජුගේ පුතා මහා අස්ථාන කුමරු

දෙවන විමලධර්මසූරිය රජු (මහා අස්ථාන කුමරු)

- ❑ ලන්දේසීන්ගේ උපකාර ඇතිව සියමෙන් උපසම්පදාව රැගෙන ඒම.
- ❑ දළදා මන්දිරයට තෙමහල් මන්දිරයක් ඉදි කිරීම.

දෙවන රාජසිංහ රජු.

මුහුණ දුන් අභියෝග

1. පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ලවන ප්‍රහාර මැඩ පැවැත්වීම.
2. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම.
3. උඩරට රදල ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවමකර ගැනීම.
4. ලන්දේසීන්ගෙන් උඩරට නිදහස් කර ගැනීම.

   - ❑ 1638 දී ගන්නෝරුව සටන ජය ගැනීම.
   - ❑ 1638 දී ලන්දේසී සමග ගිවිසුමක් අත්සන් කිරීම.
   - ❑ 1658 දී පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම.
   - ❑ ලන්දේසීන් සමග ගැටුම් ඇතිකර ගැනීම.
     II වන විමලධර්මසූරිය රජු - බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම, නායක්කාර් කුමාරිකාවක් විවාහකර ගැනීම.

ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

- ❑ අවසාන සිංහල රජු විය.

නායක්කාර් කුමාරිකාවක් විවාහ කර ගැනීම.
රජුට දරුවන් නොමැති වීම නිසා බිසවගේ සෙහොයුරාට රජුකම හිමිවන ක්‍රමය ආරම්භ වීම.

නායක්කාර් රජවරු

- ශ්‍රී විජය රාජසිංහ - බුදු දහම වැළඳගැනීම, සරණංකර හිමියන් බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම (අසාර්ථක විය)
- කීර්ති ශ්‍රී රාජසිංහ - පියා නරේනප්පා. සියම් රටේ උපාලි හිමියන් උපසම්පදාව ගෙන ඒම, විහාරාරාම ප්‍රතිසංස්කරණය සංඝරාජ තනතුර වැලිවිට හිමියන්ට ලබා දීම.
- රාජාධිරාජසිංහ - ඉංග්‍රීසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීම.
- ශ්‍රී වික්‍රම රාජසිංහ - අවසාන රජු (කණ්නසාමි කුමරු) 1803 ඉංග්‍රීසි ආක්‍රමණය පරාද කිරීම. පත්තිරිප්පුව නිර්මාණය කිරීම. මාලිගාව ඉදිරිපිට වැව (කිරි මුහුද) නිර්මාණය කිරීම. 1815 දී ඉංග්‍රීසීන්ගේ අත්අඩංගුවට ගැනීම.

මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය

පරිපාලන ව්‍යුහය

- පරිපාලනයේ රජු ඉහළම පුද්ගලයා විය.
- සහයට අධිකාරම්වරු 02 ක් විය/දිසාවේ වරු/මහ ලේකම්/බද්දේ ලේකම්
  අධිකාරම් වරයාගේ ආඥා සහ පණිවිඩ නිලධාරීන්ට ගෙනගියේ කටුපුල්ලේ පණිවුඩකරු
- මහ වාසල - මාළිගාවේ නිලධාරීන් - රජු ගේ අධීක්ෂණය යටතේ
- රට වසම - රටේ ප්‍රාදේශිය පාලනය
- බද්දේ - කුල ක්‍රම අනුව විවිධ කටයුතු වල යෙදුණු සංවිධාන ශිල්පීන්
  මඩිහේ බද්ද - ප්‍රවාහන කටයුතු, කුරුවේ බද්ද - ඇතුන් ඇල්ලීම , බඩයාල බද්ද - වළං තැනීම රදු බද්ද - රෙදි විවීම
- අධිකරණයේ ඉහළම බලතල දරන්නා රජු වේ.
- රට දිසා 21 ක් රාජ්‍ය තුළ තිබින.
- දළදා මාලිගාවේ කටයුතු නියවඩන නිළමේ අතින් සිදුවිය.

ආර්ථික ක්‍රමය

- ස්වයං පෝෂිත ආර්ථික රටාවකි.
- කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් පැවතුණි.
- කදුකර බව නිසා ගොවිබිම් සීමිත විය.
- හේන් ගොවිතැන හා ගෙවතු වගා පැවතුණි.
- යකට , ලෝහ , ලාක්ෂා , පන් ආශ්‍රිතව කර්මාන්ත පැවතුණි.
- සත්ව පාලනය ද පැවතුණි.

සමාජ සංවිධානය

- රාජධානියේ ඉඩම් , අයිතිය හා භුක්තිය මත කොටස් වී තිබුණි.
- ගබඩා ගම් , නින්දගම් , විහාරගම් , දේවාලගම් , පරවේනි ගම් වශයෙන් ඉඩම් භුක්ති වින්දහ.
- ඔවුනගේ සේවා ක්‍රමය රාජකාරි නම් විය.
- සමාජය කුළ ක්‍රමය මත පදනම් විය.
- කුල සිරිත් විරිත් හා සම්ප්‍රධායන් වලට මුල්තැන ලැබුණි.
- සමාජයේ කටයුතු අත්තම් ක්‍රමය අනුව සිදුවිය.
- පන්සල කේන්ද්‍රකරගෙන සාමයෙන් ජීවත් වූහ.

# 09. පුනරුදය

යුරෝපයේ ප්‍රධාන යුග 03 ක් දැකිය හැකිය

1. පුරාතන යුගය - ග්‍රීක රෝම ශිෂ්ඨාචාර අවධිය.
2. මධ්‍යතන යුගය - වැඩවසම් යුගය, අඳුරු යුගය (ක්‍රි.ව.500 - ක්‍රි.ව. 1500)
3. නූතන යුගය - පුනරුද සමයෙන් පසු කාලය.

මධ්‍යතන යුගයේ අවසාන කාලයේදී යුරෝපය තුළ පැරණි ග්‍රීක රෝම දැනුම නැවත භාවිතයට ගැනීම පුනරුදය ලෙස පෙන්වාදිය හැකිය.

පුනරුදය යුරෝපයේ ඇතිවීමට බලපෑ හේතු.

- 1453 දි කොන්ස්තන්තිනෝපාල් නගරය තුර්කිවරුන් විසින් අල්ලා ගැනීම.
- වෙළදාමේ දියුණුව හා නව ධනවතුන් පිරිසක් බිහිවීම.
- බුද්ධි ප්‍රබෝධයක් ඇතිවීම.
    - නව උගතුන් බිහිවීම.
    - මුද්‍රණ යන්ත්‍රය බිහිවීම.
- පල්ලියේ ආදිපත්‍ය විවේචනය වීම.

ග්‍රීක රෝම උගතුන් සහ පොතපත කොන්ස්තන්තිනෝපල් නගරයේ පුස්තකාල වලට කේන්ද්‍රගතව තිබුණි.

1453 දි තුර්කිවරුන් විසින් කොන්ස්තන්තිනෝපල් නගරය අත්පත්කරගත් අවස්ථාවේදී එහි සිටි උගතුන් බුද්ධිමතුන් පොත්පත් රැගෙන යුරෝපයේ අනෙකුත් ප්‍රදේශ වල විශ්වවිද්‍යාල කරා යාම නිසා පැරණි දැනුම ව්‍යාප්ත වීම සිදුවිය.

තවළඳ හා වානිජ කටයුතු දියුණු කරගත් මධ්‍යම පන්තියක් යුරෝපයේ වර්ධනය විම හා ඔවුන් කළාත්මක කටයුතු වලට අදවි උපකාර කිරීම. උදා :- මෙඩිසි ධනවත් පවුල

පැරණි සාහිත්‍ය, නාට්‍ය, ශබ්ද විද්‍යාව, ඉතිහාසය වැනි විෂය ඉගැන්වීම නිසා යුරෝපය තුළ බුද්ධි ප්‍රබෝධයක් ඇතිවිය.

1454 දි ගුටන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය සොයාගැනීමත් සමග පොත් බෙහෝමයක් පිටපත් කරන ලදි.

පාප් වහන්සේ හා කතෝලික සභාව ජනතාව පීඩාවට පත්කර බදු ලබාගෙන ලෞකික ජීවිතයක් ගතකිරීම නිසා ක්‍රිස්තියානි පල්ලිය විවේචනය විය.

පල්ලිය විවේචනය කළ අය අතර ජෝන් වයික්ලිප්, ජෝන් හස් ඉරාමස්, මාටින් ලූතර් වැනි අය වැදගත් වේ.

යුරෝපයේ වෙනස්වීමට පුනරුදය බලපෑ අයුරු.

- ශාස්ත්‍රීය පුනරුදය

    ග්‍රීක හා ලතින් භාෂාවන් ලිවීම හා කියවීම වැඩිවීම
    කතුවරුන් - ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ, සර් තෝමස් මුවර්, විලියම් ෂේක්ස්පියර්, ඉරාමස්
    ලියවුනු කෘති - ඩිවිනා කොමඩියා කාව්‍ය ග්‍රන්ථය, ලෝරාට සැහැසි කවි.

- මානවවාදය

    දෙවියන්ට වඩා මිනිසා උතුම් කොට සැළකීම මානවවාදයයි.
    සෑම දෙයක්ම මිනිසා මුල්කරගෙන නිර්මාණය විය.

- කලා ශිල්ප

පුනරුදයට පෙර කලා ශිල්පීන් ශ්‍රේණි වශයෙන් ඉදිමින් පල්ලියේ අනුග්‍රහයෙන් ආගමික කලා කෘති නිර්මාණය කෙරින. උදා :- ගුටෙන්බර්ග් දෙව්මැදුර
පුනරුද සමයේ කලා ශිල්පීන් තනි තනි වශයෙන් සිටිමින් මානව වාදය මුල්කර ගනිමින් ධනතුන්ගේ අනුග්‍රහය ලබමින් නිදහසේ තම නිර්මාණ සිදුකිරීම.

චිත්‍ර කලාව
ලියනාඩෝ ඩාවින්චි (මෝනාලිසා, ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම භෝජනය)
මයිකල් ආන්ජිලෝ (අවසාන විනිශ්චය, ආදම්ගේ චිත්‍රය)
රෆායල් සැන්සියෝ
මැසෙක්ෂියෝ
බොට්ටිචෙල්ලි

ලියනාඩෝ ඩාවින්චි
චිත්‍ර ශිල්පියෙක්
කවියෙක්
සංගීතඥයෙක්
විද්‍යාඥයෙක්
ප්‍රායෝගික ඉංජිනේරුවෙක්

මයිකල් ආන්ජිලෝ
චිත්‍ර ශිල්පියෙක්
මූර්ති ශිල්පියෙක්
ගෘහ නිර්මාණ ශිල්පියෙක්

ප්‍රතිමා කලාව - මයිකල් ආන්ජිලෝ
උදා :- ලොරෙන්සෝ මෙඩිසි ප්‍රතිමාව, පියේටා ප්‍රතිමාව, මෝසෙස්ගේ ප්‍රතිමාව, දාවින්ගේ ප්‍රතිමාව

ගෘහ නිර්මාණ ශිල්පය

ගෘහ නිර්මාණ ශිල්පීන් - මයිකල් ආන්ජිලෝ, ලියනාඩෝ ඩාවින්චි, රෆායල්

| මධ්‍යතන යුගයේ ගෘහ නිර්මාණ ලක්ෂණ | පුනරුද සමයේ ගෘහ නිර්මාණ ලක්ෂණ |
|---|---|
| උල් කේතු ආකාර ආරුක්කු<br>උස් වහල<br>පිරමිඩ හැඩයේ කුලුණු | රෝම ගෘහ නිර්මාණ ශිල්පිය<br>වටකුරු ආරුක්කු<br>උස් කුලුණු<br>අර්ධ ගෝලාකාර ශිඛර<br>උදා :- රෝමයේ ශාන්ත පීතර බැසිලිකා දේවස්ථානය, ප්ලෝරන්ස් ආසන දෙව්මැදුර |

විද්‍යාත්මක දියුණුව

විශ්වය පිළිබඳව

නිකලස් කොපර්නිකස් - පෘතුවිය ගෝලාකාර බව
ග්‍රහ ලෝක සූර්යයා වටේ පරිභ්‍රමණය වීම
නූතන තාරකා විද්‍යාවේ පියා

අයිසෙක් නිව්ටන් - ගුරුත්වාකර්ෂණ නියමය

ජොහැන්නස් කෙප්ලර් - ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාරව ගමන් කිරීම

ගැලිලියෝ ගැලිලි - දුරදක්නය නිපදවීම
චන්ද්‍ර ආවාට
බ්‍රහස්පති ග්‍රහයාගේ උප ග්‍රහයන් සොයා ගැනීම
අත්හදා බැලීමේ පියා

වෛද්‍ය විද්‍යාව පිළිබඳ

විලියම් හාවේ - මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම

වෛද්‍ය පැරසල්සස් - රෝග සෑදීමට හේතු සහ ඒවාට ප්‍රතිකර්ම සොයා ගැනීම

මයිකල් සර්ටෙස් - රුධිරය සොයා ගැනීමහෘදයේ දකුණු කෝෂයෙන් පිටවී පෙනහැලි මගින් පිරිසිදු කර යලිත් හවවතට පැමිණ ශරීරය පුරාම විසිරීම

ජොහැන්ස් ගුටන්බර්ග් - මුද්‍රණ යන්ත්‍රය නිපදවීම.

පුනරුදය නිසා යුරෝපයේ ඇති වූ වෙනස්කම්

1. දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව.
   ජාතික රාජ්‍යයන් ඇති වී ධනවත් මධ්‍යම පන්තියක් බිහිවිය.

2. ආර්ථික නවෝදයක් ඇතිවිය.
   වෙළඳ කටුයතු වල දියුණුම , නව මුහුදු මාර්ග සොයා ගැනීමත් සමග වෙළඳ මුදල් නෝට්ටු , චෙක්පත් බැංකුආරම්භ වීම. භාණ්ඩ යුරෝපයට රැගෙන ඒම.

3. නව වෙළඳ මාර්ග සොයා ගැනීමට පෙළඹීම.
   නාවික ගමන් වල සුරක්සිතබව හා පෘථිවිය ගෝලාකාර බව දැනගැනීම. මාලිමාව, ටොලමිගේ ලෝක සිතියම. පෘතුගාලයේ නාවික හෙන්රි, ස්පාඤ්ඤයේ පර්ඩිනන්ඩ් හා ඉසබෙලා.

පුනරුදයේ ගෝලීය ප්‍රවණතාවය

- ඉතාලියේ ප්ලොරන්ස් නගරයෙන් ආරම්භ වී යුරෝපය පුරා ව්‍යාප්ත විය.
- දේශ ගවේෂණය නිසා ආසියා , අප්‍රිකා හා ඇමරිකා මහාද්වීප වලට ද පැතිර ගියේය.
- දේශපාලන , වෙළඳ , සමාජමය හා සංස්කෘතික අංශයන්ගෙන් යුරෝපීය චින්තනය , තාක්ෂණය හා විද්‍යාත්මක දැනුම ව්‍යාප්ත විය.

පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම.

දේශපාලන වෙනස්කම්

- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම බිහිවීම.
- නව අධිකරණ ක්‍රම ඇතිවිය.

ආර්ථික වෙනස්කම්

- වානිජ ආර්ථික රටාවක් ඇතිවිය.
- ධනවත් මධ්‍යම පන්තියක් බිහිවිය.

සමාජ හා සංස්කෘතික වෙනස්කම්

- යුරෝපීය චින්තනය ව්‍යාප්ත වීම.
- බටහිර අධ්‍යාපන ක්‍රමය ඇතිවිය.

පෘතුගීසීන්, ලන්දේසීන්, ඉංග්‍රීසින්ගෙන් මෙරටට ලැබුණි.

# 10. ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

ආසියාවට පැමිණි යුරෝපා ජාතින් ⟶ පෘතුගීසීන් , ලන්දේසීන් , ඉංග්‍රීසීන් , ප්‍රංශවරුන්

**පෘතුගීසීන් ආසියාවට පැමිණීම.**

- ඈත අතීතයේ සිටම ආසියාව හා යුරෝපය අතර පැවති වෙළඳ මාර්ගවල ප්‍රධාන කේන්ද්‍රස්ථානය කොස්තන්තිනෝපල් නගරය විය.
- වර්ෂ 1453 දී මුස්ලිම්වරු කොන්ස්තවන්තිනෝපල් නගරය යටත් කරගෙන යුරෝපයට ගෙනගිය භාණ්ඩ වල මිල ඉහළ දැමූහ.
- භාණ්ඩ හිගයක් ඇති කළහ.
- භාණ්ඩ සැපයීම පමා කළහ.

**යුරෝපා ජාතින් ආසියාවට පැමිණීමේ අරමුණු.**

- ආර්ථික වාසි ලබා ගැනීම.
- ආගම ප්‍රචාරය කිරීම.
- ජාත්‍යන්තර කීර්තිය දිනා ගැනීම.

**පෘතුගීසීන්**

- ආසියාවට පැමිණි ප්‍රථම යුරෝපා ජාතිය වේ. - මධ්‍යස්ථානය කැලිකට්
- 1505 දී පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා වුයේ ෆැන්සිස්කු ද අල්මේදාය.
- පෘතුගීසීන් විසින් මුල් අවධියේ ලංකාව හැඳින්වුයේ සෙයිලන් ලෙසය.
- ලංකාවට පැමිණි මුල්ම පෘතුගීසි කණ්ඩායම ලොරෙන්සෝ ද අල්මේදා ඇතුලු පිරිස වේ.

**පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට පැවති රාජ්‍ය 03**

1. කෝට්ටේ ⟶ VIII වන වීර පරාක්‍රමබාහු රජු
2. උඩරට ⟶ සේනාසම්මත වික්‍රමබාහු රජු
3. යාපනය ⟶ පරරාජසේකරම්

- VIII වන වීර පරාක්‍රමබාහු රජුගෙන් පසුව VI වන විජයබාහු කෝට්ටේ රජ වීම.

## කෝට්ටේ රාජ්‍ය ( 1521 ඇති වූ විජයබා කොල්ලයෙන් පසු )

1. කෝට්ටේ ⟶ VII වන බුවනෙකබාහු
2. සීතාවක ⟶ මායාදුන්නේ
3. රයිගම ⟶ රයිගම බණ්ඩාර

වශයෙන් කොටස් 03 කට බෙදා පාලනය කිරීම.

- VII වන බුවනෙකබාහු රජු තම පෞද්ගලික ආරක්සකයන් ලෙස පෘතුගීසීන් පත්කර ගැනීම.
- කෝට්ටේ බුවනෙකබාහු රජුගේ අභාවයෙන් පසු එහි රජු වූ ධර්මපාල පෘතුගීසීන් විසින් මෙහෙය වූ රූකඩයක් බවට පත්විය.
- ධර්මපාල රජු භෞතිස්ම වීම.
- ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් තම රාජ්‍ය උරුමය පෘතුගීසීන්ට පැවරීම.
- ධර්මපාල රජු ගේ පියා වූ වීදියේ බණ්ඩාර පෘතුගීන්ට විරුද්ධව කැරලි ගැසීම.

උඩරට රාජධානිය තුළ පෘතුගීසීන් තම බලය පැතිරවීමට ගත් උත්සාහය නිසා උඩරැටියන් සමග ඇතිකරගත් සටන්

| සටනේ නම | වර්ෂය | ස්ථානය | පෘතුගීසි සෙන්පතියා | රජු | සටනේ ප්‍රතිඵල |
|---|---|---|---|---|---|
| මුල්ලේරියා සටන | | මුල්ලේරියාව | අපෝන්සු පෙරෙයිරා | මායාදුන්නේ පුතා (ටිකිරි බණ්ඩාර) | පෘතුගීසීන් ආසියානු රටකදී ලැබුණු දරුණුතම පරාජය පෘතුගීසීන් 1600 ක් මියගිය හ. |
| දන්තුරේ සටන | 1594 | දන්තුරේ | පෙරෝ ලොපෙස් ද සූසා | I වන විමලධර්මසූරිය රජු | පෘතුගීසීන් අන්ත පරාජයකට පත්විය.<br>I වන විමලධර්මසූරිය රජු කුසුමාසන දේවිය විවාහ කරගෙන නව රාජවංශයක් ආරම්භ කිරීම. |
| බලන සටන | 1602 | බලන | දොන් ජෙරනිමෝ ද අසවේදු | I වන විමලධර්මසූරිය රජු | පෘතුගීසීන් සැලකිය යුතු පිරිසක් මැරුණි. පෘතුගීසීන්ගේ අවි ආයුධ උඩරැටියන් අතට පත්විය. |
| රන්දෙණිවල සටන | 1630 | රන්දෙණිවල | කොන්ස්තන් තිනු ද සා | සෙනරත් රජු | පෘතුගීසීන් 350 ක් පමණ ජීවිතක්ෂයට පත්වීම.<br>කොන්ස්තන්තිනු ද සා පවා මරණයට පත්වීම. |
| ගන්නෝරුව සටන | 1638 | ගන්නෝරුව | දියෝගෝ ද මෙලෝ | II වන රාජසිංහ | පෘතුගීසීන් අන්ත පරාජයකට පත්වීම.<br>දියෝගෝ ද මෙලෝ පවා ජීවිතක්ෂයට පත්වීම. |

**පෘතුගීසීන් උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට හේතු**

- උඩරට ජනතාව සෑම විටම රජුට සහය වීම.
- පෘතුගීසීන් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහත රැටියන් උඩරට දී රජුට එකතුවීම.
- උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞෂල්‍යය.
- උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීම.
- පෘතුගාලය කුඩා රටක් වීම නිසා පෘතුගීස්න්ට යුද්ධ කිරීමට තරම් අවශ්‍ය සේනාවක් සැපයීමට පෘතුගාලය අපොහොසත් වීම.

**පෘතුගීසීන් හා යාපනය**

- පෘතුගීසීන් විසින් 1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ සේනාවක් යවා යාපනය යටත් කර ගැනීම.
- යාපනයේ අවසාන පාලකයා සංකිලි රජු විය.
- වර්ෂ 1621 දී පෘතුගීසීන් බලය පිහිටුවීම.

**යාපනය රාජධානිය බිඳවැටීමට හේතු**

- යාපනයේ රාජය උරුමකරුවන් අතර බල අරගලය.
- යාපනයේ ජනතාව බෙදී සිටීම.
- ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් එහි පාලකයින්ට නොසිටීම.
- උඩරට මෙන් ස්වභාවික ආරක්ෂාවක් යාපනයට නොතිබීම.

**ශ්‍රී ලංකාව හා ලන්දේසීන්**

- ලන්දේසීන්ගේ මව්රට → ඕලන්දය
- ලන්දේසීන්ගේ ආගම → රෙපරමාදු ආගම
- ලන්දේසීන් පෙරදිග පිහිට වූ වෙළඳ සමාගම → පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම ( VOC සමාගම )
- ලන්දේසීන්ගේ පෙරදිග පිහිටි මූලස්ථානය → ජාවා දූපතේ බතාවිය
- ලන්දේසීන් ආසියාවට පැමිණීමේ ප්‍රධාන අරමුණු → ආර්ථික වාසි ලබා ගැනීම
- ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි ජාතිකයා → ජොරිස් වැන් ස්පිල්බර්ජන් / සිවේල්ද වර්ට්
- ලංකාවට පැමිණි ලන්දේසි දූත කණ්ඩායම් මුණගැසුණු රජු → I වන විමලධර්මසූරිය රජු
- වර්ෂ 1638 වර්ෂයේදී ලන්දේසීන් සමග ගිවිසුමක් ඇතිකරගත් රජු → II වන රාජසිංහ රජු
- ලන්දේසි ලිපි වල II වන රාජසිංහ රජු හැඳින්වූ නාමය → ත්‍රි සිංහලාධීශ්වර
- 1638 ගිවිසුමේ ලන්දේසීන් කඩ වළ වගන්තිය නම් පෘතුගීසීන්ගෙන් අල්ලාගන්නා ලද බල කොටු වල රජු අදහස් කරන්නේ නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකග වීම.
- පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසීන්ට වසර 20 ක් ගතවිය අවසානයට අල්ලා ගනු ලැබුවේ යාපනය බලකොටුවයි.

**ලන්දේසීන් උඩරට රාජ්‍ය සමග සාමකාමී සබඳතා පැවැත් වූ ආකාර 02**

- උඩරට රජු සමග සබඳතා පැවැත්වීම.
- ලිපි හුවමාරු කර ගැනීම.
- ලන්දේසීන්ගේ සහය ගෙන පෘතුගීසීන්ව 1658 වර්ෂයේදී ලංකාවෙන් නෙරපා දැමීමට II වන රාජසිංහ රජුට හැකි විය.
- ක්‍රි. ව. 1764 බැරන් වැන් එක් ලන්දේසි ආණ්ඩුකාරවරයා යටතේ ලන්දේසි සේනාංක 06 ක් මාර්ග 06 කින් යවමින් උඩරට ආක්‍රමණය කිරීම.

උඩරට රාජ්‍ය සම්බන්ධව ලන්දේසි ප්‍රතිපත්ති

- ලන්දේසීන්ට පාඩු වන ගැටුම් ඇතිකර නොගැනීම.
- උඩරට රඡුගේ හොඳහිත දිනා ගැනීම.
- උපසම්පදාව ගෙන ඒමට ලන්දේසි නැව් ලබා දීම.

උපරිම ආර්ථික වාසි ලබා ගැනීමේ ප්‍රතිපත්ති

- උඩරට රජු විදේශීයන් සමග වෙළඳ සබඳතා ඇතිකර ගැනීම අවහිර කිරීම.
- ගැටුම් අවස්ථාවේ කඩවත් වසා දැමීම.
- පහතරට වී ගොවිතැන දියුණු කිරීම. ඌරුබොක්ක, මුතුරාජවෙල, ගිංගං නිම්නය
- කුරුඳු වගා කිරීම හා නීති රීති දැඩි කිරීම.
- ලාබ ලැබිය හැකි වෙනත් භෝග වගා කිරීම. (උක්, කෝපි, කපු)


[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

# 11 ශ්‍රේණිය

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]